ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

# වාර්ෂික වාර්තාව

# 2016

NIOSH

National Institute of Occupational Safety and Health • Sri Lanka

# ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

**ගරු. ඩබ්ලිව්.ඩී.ජේ.සෙනෙවිරත්න**

අමාත්‍යතුමා - කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යාංශය

**ගරු රවීන්ද්‍ර සමරවීර**

රාජ්‍ය අමාත්‍ය - කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යාංශය

**එස්.එම්.ජී. ජයරත්න**

ලේකම්, කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යාංශය

සභාපති, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

**වෛද්‍ය එන්.සී. අමරසිංහ**

අධ්‍යක්ෂ ජනරාල්, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

**විගණන කමිටුව**

**වෛද්‍ය එන්.සී.අමරසිංහ** - අධ්‍යක්ෂ ජනරාල්, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

**පී.එම්.කේ. හෙට්ටිආරච්චි** - සභාපති, අධ්‍යක්ෂ, මුදල් අමාත්‍යාංශය

**ඩබ්ලිව්.ඩී.බී.ජේ.වැලිවත්ත** - නිරික්ෂක, විගණන අධිකාරි, විගණකාධිපති දෙපාර්තමේන්තුව

**එම්.ආර්.ජී.ඒ.බී.මුතුකුඩේ** - අභ්‍යන්තර විගණක, කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය

**පී.එම්.කේ.පෙරේරා** - සහකාර අධ්‍යක්ෂ, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

බැංකුව - මහජන බැංකුව - නාරාහේන්පිට

## පටුන.........


| | | |
|---|---|---|
| 01 | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය පිළිබඳ හැඳින්වීම | 05 |
| 02 | දැක්ම, මෙහෙවර, අරමුණු | 07 |
| 03 | කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගරු ඩබ්ලිව්.ඩී.ජේ.සෙනෙවිරත්න මැතිතුමාගේපණිවුඩය | 08 |
| 04 | ලේකම්තුමාගේ පණිවුඩය | 09 |
| 05 | අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවුඩය | 10 |
| 06 | අධ්‍යක්ෂ මණ්ඩලය ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය | 12 |
| 07 | සංවිධාන ව්‍යුහය | 14 |
| 08 | ජාතික වෘත්තීය සුරක්ෂිතතා ආයතනයේ පොදු අරමුණු | 15 |
| 08 | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ වැඩසටහන් සහ ක්‍රියාකාරකම් | 17 |
| 09 | 2016 වර්ෂයේ පැවැත්වූ පාඨමාලා , වැඩමුළු හා සම්මන්ත්‍රණ | |

වැඩමුළු

- සුපරීක්ෂකවරුන් / තත්ත්ව පරීක්ෂකවරුන් සඳහා වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ වැඩමුළුව 19
- ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සුපරීක්ෂකවරුන් සඳහා තුන්දින පුහුණුව 20
- පාරිසරික ආරක්ෂාව සහ අපද්‍රව්‍ය කළමණාකරණ පුහුණුව 20
- ඉදිකිරීම් ආරක්ෂණ පුහුණුව 20
- ආතති කළමණාකරණ පුහුණු වැඩසටහන 21
- විදුලි ආරක්ෂණ පුහුණු වැඩසටහන 21
- බොයිලේරු ක්‍රියාකරවන්නන් පුහුණු කිරීම 22

පාඨමාලා

- වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍යය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව 22
- වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍යය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 23

**සම්මන්ත්‍රණ**

- සම්මාන උළෙල පිළිබඳ දැනුවත් කිරීමේ සැසිය **26**
- ජාතික වෘත්තීය සුරක්ෂිතතා සතිය **27**
- හයවන ආසියානු වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පර්යේෂණ ආයතනයේ රැස්වීම **28**
- ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සමුළුව **30**

**කර්මාන්ත සඳහා වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබද කර්මාන්තය සඳහා උපදේශන සේවාව** **33**

**උපකරණ නිවැරදි ලෙස භාවිතය පිළිබද උපදේශන සේවාව සැපයීම** **34**

**වැඩ කිරීමේ යෝග්‍යතාව- නොමිලේ වෛද්‍යකදවුරක් පැවැත්වීම** **35**

**වෘත්තීය සෞඛ්‍ය සුරක්ෂිතාව පිළිබද වතු කම්කරුවන් හා පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩමුළුව** **36**

**වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සමීකරණ සහ පර්යේෂණ** **36**

**දැනුවත් කිරීමේ සහ පුහුණු වැඩසටහන්** **37**

**2011 වසරේ සිට 2016 වසර දක්වා NIOSH ප්‍රගතිය** 40

**වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ අධ්‍යයනය සඳහා වූ පුස්තකාලය** 42

**ආයතනයේ මූල්‍ය ප්‍රගතිය** 43

**ගිණුම්කරණ වලට අදාල සටහන් ගිණුම්කරණ ප්‍රතිපත්ති** 45

**දේපල පිරියත හා උපකරණ** 47

**විගණකාධිපති වාර්තාව** 48

# ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

**හැඳින්වීම**

2009 අංක 38 දරණ ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතන පනත මඟින් කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ අනුබද්ධ ආයතනයක් ලෙසින් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය පිහිටුවන ලදී. මෙරට තුල මනා සෞඛ්‍ය හා ආරක්ෂණ ක්‍රියාමාර්ග තුළින් වෘත්තීය අනතුරු හා වෘත්තීය රෝගවැළකීම හා නිවැරදි ආරක්ෂිත ප්‍රතිපත්ති හා ක්‍රමවේදයන් පිළිපැදීම තුළින් යහපත් වැඩ පරිසර තත්ත්වයක් සෑම පුද්ගලයෙකුටම ලබාදීමට අප ආයතනය නිරතුරුවම කැපවී සිටින අතර මෙවැනි පුහුණුවක් තුළින් ප්‍රතිලාභ ලබාගත හැකි සේවක සේව්‍යය හා ඕනෑම පුද්ගලයකු සඳහා අවශ්‍ය අධ්‍යාපනයද අප විසින් ලබාදෙනු ලබයි.

නිරෝගි ශ්‍රම බලකායක් නගා සිටුවීම ඕනෑම රටක තිරසාර ආර්ථික සංවර්ධනයේ ඉතා වැදගත් අංගයක් ලෙස පිළිගනු ලැබේ.ශ්‍රී ලංකාව පුරා වෘත්තීය සෞඛ්‍ය ආරක්ෂාව සහිත වැඩකරන පරිසරයක් ක්‍රියාත්මක කිරීම මඟින් මූලික මිනිස් අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට අනුග්‍රාහ දැක්වීම අප ආයතනයේ මූලික පරමාර්ථයයි.

වර්තමානය වන විට විවිධ රාජකාරිවල නිරත වූ පුද්ගලයින් විවිධ සමාජීය, වෘත්තීයමය හේතූන් බලපා ඇති බව පර්යේෂණවලින් තහවුරු වී ඇත. එබැවින් වැඩ කිරීම නිසාවෙන් සේවක පවුල්වල සමතුලිතතාවය බිඳවැටීමට ඇති ඉඩකඩ ප්‍රමාණය බෙහෙවින් වැඩිය. එහි ප්‍රතිඵලයක් ලෙස සෞඛ්‍ය පිළිබඳ අල්ප වූ දැනුම සහ පුද්ගලයින්ගේ සමස්ත මනෝ සමාජීය තත්ත්වය යන සාධකයන් පහළ මට්ටමක පවතී. ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය වන මිලියන 8.7 ක් වේ. ඔවුනට මෙම තත්ත්වයන් බලපානු ලබයි. සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ විශේෂිත වූ මාතෘකා පිළිබඳව ආයතන හා සංවිධාන අතර නිරතුරු සංවාදයන් ඇති කිරීමට දිරිගැන්වීම සහ පහසුකම් සපයයි. වෘත්තීමය තුවාල සිදුවීම හේතුවෙන් ඔවුන්ගේ සේවය සැපයීමට නොහැකි වීම නිසා ආර්ථික වශයෙන් කඩා වැටීමකට ලක්වීමට ඇති අවකාශය ඉතා වැඩිය. එබැවින් සෞඛ්‍ය සම්පන්න ශ්‍රම බලකායක් ඇති කිරීමටත් වැඩි ඵලදායිතාවක් ඇති කිරීම උදෙසා සේවා ස්ථානයේ සිදුවන අනතුරු අවම කිරීම සිදු කළ යුතුය.

වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ ප්‍රධානත්වයෙන්, සෞඛ්‍ය අභියෝගයන්ට විසඳුම් සපයන සම්පත්, තොරතුරු, මෙවලම් සහ කුසලතා සැපයීම යන මාතෘකා ඔස්සේ විශේෂඥ පුහුණු වැඩසටහන් පවත්වනු ලබයි. එමෙන්ම ජාතික, ජාත්‍යන්තර ආයතන විශ්වවිද්‍යාල හා වෙනත් පිහිටුවා ඇති එවැනි සංවිධාන සමග සම්බන්ධීකරණය කිරීම මගින් සම්බන්ධතා ජාල ගොඩනගමින් වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතතා විෂය දියුණු කිරීම හා පර්යේෂණ වැඩි දියුණු කිරීම සිදුකරනු ලබයි.

අප ආයතනය මගින් වෛද්‍ය පරීක්ෂණ, පාරිසරික සමීක්ෂණ, ආතති කළමනාකරණ පුහුණු

වැඩසටහන් විශාල කලාපීය පරිමාණයක් ආවරණය වන පරිදි පැවැත්වීම, සම්මන්ත්‍රණ සහ ජාලකරණ, තිරසාර වැඩ පිළිවෙත් සඳහා පහසුකම් සපයයි.

NIOSH ආයතනයක් ලෙස නිරන්තරයෙන් අපක්ෂපාතීව, ලෝක මට්ටමේ වෘත්තීය සෞඛ්‍ය සුරක්ෂිතතා සේවාවක් සහ වෘත්තීය අනතුරු හා රෝග අවම කිරීම අරමුණු කරගත් ආරක්ෂිත හා සෞඛ්‍ය සම්පන්න වැඩ පරිසරයක් නිර්මාණය කිරීම සහ ස්වයං මූල්‍ය සම්පාදන ආයතනයක් ලෙස ස්ථාපිත කිරීම හා පවත්වාගෙන යාම ඉලක්ක කරගනිමින් සිදු කෙරේ.

ඉහත සඳහන් ක්‍රියාකාරිත්වයන් ඉතා සාර්ථක ලෙස ඉටුකරමින් උපරිම තෘප්තියක් පාරිභොගිකයින්හට ලැබෙන ලෙස ඵලදායී සේවාවක් සැපයීමට හැකියාව ලැබීම අප ඉතාමත් තෘප්තියට සහ සතුටට පත්වන්නෙමු. 2009 අංක 38 දරණ NIOSH පනතෙහි සඳහන් වන අරමුණු සාක්ෂාත් කර ගැනීම ඉතා කෙටි කාලයක් තුළ ලබාගැනීමට හැකි වූ බව පසු විමරම් තුළින් පැහැදිලි වනු ඇත. එමෙන්ම, බොහෝ ආයතනයන් ජාතික වෘත්තීය සුරක්ෂිතා හා සෞඛ්‍ය ආයතනයේ සේවාවන් ලබාගෙන ඇත. මෑත අතීතයේ දී, එම ආයතනයන්හි සහයෝගය ඇතිව අදාළ ආයතනවල සේවකයින්ගේ සෞඛ්‍ය සුරක්ෂිතතාව හා සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් දැනුවත් කිරීම විවිධ වැඩසටහන් මගින් සිදුකෙරේ. මෙම වසරේ දී අපගේ සේවාවන්ගේ ගුණාත්මකභාවය වැඩි දියුණු වී ඇති බැවින් බොහෝ කර්මාන්ත අතර සිදුවන වෘත්තීය අනතුරු හා රෝග අවම කිරීමට විශාල දායකත්වයක් සපයා ඇත.

නිදහස් වෙළෙඳ කලාපයේ මෙන්ම කර්මාන්ත අංශයේ, රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන ක්ෂේත්‍රය, කාර්මික අංශය වැනි සියළුම කර්මාන්ත වල NIOSH සන්නාමය "NIOSH Brand" යනුවෙන් හඳුන්වා දීමය. එමෙන්ම ඔවුන්ගේ ඉල්ලීම මත සේවකයාගේ ආරක්ෂාව හා සෞඛ්‍ය වැඩි දියුණු කිරීම සඳහා ඉතා සාර්ථක සේවාවක් සැපයීම අප විසින් සිදු කරනු ලබයි.

නිවැරදිව යන්ත්‍ර හා මෙවලම් භාවිත කිරීම පිළිබඳව අප පාඨමාලා තුළින් මූලික වශයෙන් ඉගැන්වීම් කටයුතු සිදුකරනු ලැබේ. එබැවින් රැකියා ස්ථානයේ අවධානම් සහගත තත්ත්වය පහවී සුරක්ෂිත වැඩ පරිසරයක් තුල සතුටින් රැකියාවල නිරතවන වෘත්තීකයන් බිහිවීම අප ආයතනයේ ප්‍රධාන අරමුණ හා ඉලක්කය වේ.

දැක්ම :- "සැමට වෘත්තීය සුරක්ෂිතතාව සෞඛ්‍ය හා සුභසාධනය ලබාදීම"

මෙහෙවර:- "සේවා ස්ථානවල සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය සහතික කරලීම සහ ඵලදායිතාව වර්ධනය කිරීම සඳහා සියළු ආකාරයේ රැකියා උපද්‍රවයන් වළක්වාලීම පිණිස අධ්‍යාපනය පුහුණුව හා පර්යේෂණය තුළින් ත්‍රෛයිපාර්ශවීය කොටස් කරුවන් සවිබලගැන්වීම."

**කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ අමාත්‍යතුමාගේ පණිවුඩය.**



2009 අංක 38 දරණ ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතන පණත මගින් කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ අනුබද්ධ ආයතනයක් ලෙසින් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය පිහිටුවන ලදී. එමෙන්ම 2005 අප්‍රේල් 28 වන දින පිහිටුවන ලද ව්‍යවස්ථාපිත සහයෝගිතා ආයතනයකි. ශ්‍රී ලංකාව තුළ නිසි සෞඛ්‍ය හා ආරක්ෂණ ක්‍රමවේදයන් වැඩිදියුණු කිරීම හා දැනුවත් කිරීම් වැඩිදියුණු කිරීමට ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය කැපවී කටයුතු කර ඇත. දැනුවත් කිරීමේ පුහුණුව, වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ පර්යේෂණ, නවීකරණය කරන ලද තොරතුරු බෙදා හැරීම, උපදේශන සේවා සැපයීම අපගේ වගකීමයි. මෙම ආයතනය විසින් සිදුකරන අනෙකුත් සියලුම අංශවල සේවකයන් වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ දැනුවත් කිරීම් හා පුහුණු කිරීම් කටයුතු මා විසින් අගය කරන්නෙමි.

පසුගිය වසර කිහිපය තුළ සිදුකරන ලද ක්‍රියාකරකම් මගින් ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සම්පන්න ශ්‍රම බලකායක් ඇති කිරීමේ කැපවීම හා ජාතික වෘත්තීය සුරක්ෂිත පරිසරයක් ගොඩ නැගීමට කැප වූ ප්‍රජාව මම අගය කරමි.

ජාතික වෘත්තීය සුරක්ෂිතතා ආයතනයේ අභිවෘද්ධිය උදෙසා අනුපමේය මෙහෙයක් ඉටුකරන ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය ඇතුළු සියලුම කාර්යය මණ්ඩලයට මාගේ කෘතඥතාවය පුදකර සිටිමි.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න.**

**අමාත්‍ය කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය.**

**කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශ ලේකම්තුමාගේ පණිවුඩය.**



2016 වසරේ දී ජාතික වෘත්තීය සුරක්ෂිතතා ආයතනය විසින් ශ්‍රී ලංකා සේව්‍ය, සේවක පක්ෂ වෙත ඉටුකරන ලද සේවාවන් හා එහි සංවර්ධනයේ ප්‍රගතිය දැක්වෙන මෙම වාර්ෂික වාර්තාවට පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම මා භාගයක් කොට සලකමි. ශ්‍රී ලංකාවේ වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතතාවයෙන් යුක්ත ආරක්ෂිත පරිසරයක් බිහිකිරීමට කැපවීම සඳහා සියලු කාර්ය මණ්ඩල සමාජික සමාජිකාවන්ගේ කැපවීම මා විසින් අගය කරන්නෙමි.

ජාත්‍යයන්තර කම්කරු සංවිධානය විසින් ප්‍රකාශයට පත්කරන ලද ගොලීය ඇස්තමේන්තුවට අනුව වසරකට මිලියන 2.3ක මරණ සංඛ්‍යාවක් වෘත්තීය අනතුරු නිසා සිදුවන බව හේතු සාධක ඇතිව ගනන් දක්වා ඇත. වැඩිම මරණ අනුපාතය මිලියන 2ක් වෘත්තීය අනතුරු නිසා සිදු වූ අතර ඉතිරි පිරිසට තුවාල සිදු විය. රැකියා තක්සේරු කිරීම් හා රෝගාබාධ සඳහා වන ආර්ථික පිරිවැය, රටේ ඇස්තමේන්තු වල දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.8ත් 6ත් අතර වන අතර එය සාමාන්‍යයෙන් 4%කි. අනතුරු සිදු වීමට නොයෙකුත් හේතු සාධකයන් බලපෑ හැක. ඒ අනුව සේවකයාගේ පවුලේ තත්ත්වය, නිවසේ පරිසරය, භාවිත කරන උපකරණ වර්ග සහ භාවිත කරන ද්‍රව්‍ය යනාදිය මඟින් අනතුරු හෝ තුවාල සිදුවිය. මෙම තත්ත්වයන්ගෙන් සිදුවන අනතුරු අවම කිරීම උදෙසා ජාතික වෘත්තීය සුරක්ෂිතතා ආයතනය සිදුකරන කැපවීම මා විසින් අගය කරමි. මෙම හේතු සාධකයන්ට අමතරව වෙනත් කොන්දේසි ද අනතුරු සිදු වීම සඳහා බලපෑම් කල හැක. ඒ අනුව මානසික පීඩනය, අඩු ආලෝකය, ආරක්ෂිත උපකරණ නොමැති වීම, උපකරණ භාවිතය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නොමැතිවීම, අඩු අධ්‍යාපන තත්ත්වය යනාදි සාධකයන් නිසා වෘත්තීය අනතුරු සිදු විය හැකි බැවින් අනතුරු අවම කිරීම හා සියලු සේවකයන්ගේ සුරක්ෂිතතාවය වර්ධනය කිරීම උදෙසා ඔබ ආයතනයෙන් සිදුකරන සේවය ඉතා අගය කරන්නෙමි.

වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතනය, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ අනුබද්ධ ආයතනයක් ලෙස ශ්‍රී ලංකාවේ ආරක්ෂිත සංස්කෘතියක් බිහිකිරීමෙහිලා ප්‍රමුඛත්වය ගෙන වැඩ කිරීම මා විසින් අගය කරන්නෙමි.

රට තුළ වෘත්තීය සෞඛ්‍ය සුරක්ෂිතතාවයෙන් යුක්ත පරිසරයක් බිහිකිරීමට මා විශේෂයෙන් ඔබ ආයතනයේ කාර්ය මණ්ඩලය ඇගයීමට කැමැත්තෙමි.

**එස්. එම්. පී ජයරත්න.**  
**ලේකම්.**  
**කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය.**  
**සභාපති, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය**

**ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවුඩය.**



2009 අංක 38 දරණ ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතන පණත මඟින් කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ අනුබද්ධ ආයතනයක් ලෙසින් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය පිහිටුවන ලදී. එමෙන්ම 2005 අප්‍රේල් 28 වන දින පිහිටුවන ලද ව්‍යවස්ථාපිත සහයෝගිතා ආයතනයකි. මෙරට තුළ මනා සෞඛ්‍ය හා ආරක්ෂණ ක්‍රියාමාර්ග තුළින් වෘත්තීය අනතුරු හා වෘත්තීය රෝග වැළකීම හා නිවැරදි ආරක්ෂිත ප්‍රතිපත්තියක් හා ක්‍රමවේදයන් පිලිපැදීම තුළින් යහපත් වැඩ පරිසර තත්ත්වයක් සෑම පුද්ගලයෙකුටම ලබාදීමට අප ආයතනය නිරතුරුවම කැපවී සිටින අතර මෙවැනි පුහුණුවක් තුළින් ප්‍රතිලාභ ලබාගත හැකි සේවක සේව්‍යය හා ඕනෑම පුද්ගලයකු සඳහා අවශ්‍ය අධ්‍යාපනය ද අප විසින් ලබාදෙනු ලබයි. වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතනයේ ඉලක්කය වූ කලී ස්වයං මූල්‍ය සම්පාදිත ආයතනයක් වශයෙන් අපක්ෂපාතීව ජාත්‍යයන්තර මට්ටමින් වෘත්තීය සුරක්ෂිතාව හා සෞඛ්‍ය සේවා සැලසීම හා ආරක්ෂාකාරී වූත් සෞඛ්‍යයට හිතකර වැඩ පරිසරයක් ශ්‍රී ලංකාව තුල නිර්මාණය කිරීම සහ ආරක්ෂිත සංස්කෘතිකයක් ශ්‍රී ලංකාව තුල ඇති කිරීමය. සියලූ ජනතාව සඳහා ආරක්ෂිත වැඩ පරිසරයක් නිර්මාණය කිරීමත්, නඩත්තු කිරීම හා පවත්වාගෙන යාමත් නිසි සෞඛ්‍ය හා ආරක්ෂක ක්‍රමවේදයක් නිර්මාණය කිරීමටත් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය කැපවී කටයුතු කරනු ලබයි.

ආයතනයේ අරමුණ වන්නේ ස්වයං මූල්‍ය සම්පාදන ආයතනයක් වන අතරම කර්මාන්තයන් සඳහා ලෝක මට්ටමේ වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සේවාවක් සැපයීමයි. අපගේ සියලුපාර්ශවකරුවන්ට වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය තොරතුරු ලබාදීම සඳහා ජාතික සුරක්ෂිතතා ආයතනය ප්‍රමුඛත්වය ගෙන කටයුතු කරනු ලැබේ.

වෘත්තීයමය රෝගාබාධ වැලැක්වීම, වෘත්තීය හදිසි අනතුරු, වෘත්තීය සුරක්ෂිතතාව සහ බලපෑම් කෙරෙහි බලපෑම් කිරීම, වෘත්තීමය අනතුරු අවම කිරීම, ඉහළ මට්ටමේ වෘත්තීය සෞඛ්‍යාරක්ෂාව සහ ආරක්ෂණ පිළිවෙත් පිළිබඳව පුහුණුවක් ලබාදීම සහ රෝගාබාධ අවමකිරීමේ වගකීම, සිසුන් සඳහා අවශ්‍ය වන වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පුහුණුව සැපයීම, කර්මාන්තයට සේවා කටයුතු සඳහා යෝග්‍යතාව සැපයීම, NIOSH විසින් සිදුකරනු ලබන සේවා අතර ප්‍රධාන වේ.

අප ආයතනය විසින් සංවිධාන සඳහා ලබාදෙනු ලබන පුහුණුවෙහි සේවක සේවිකාවන් වැඩකරන සේවා ස්ථානයේ වැඩකරන අතර වාරයේ අනෙකුත් සේවකයින්ගේ ආරක්ෂාව සලසා දිය යුතු ආකාරය පිළිබඳ මනා පුහුණුවක් ඔවුනට ලබාදේ. ඒ අනුව වැඩපල ස්ථානයේ වෘත්තීය අනතුරු හා උවදුරු කලින් හදුනාගැනීමටත්, අවධානම් ඇති ස්ථාන හඳුනාගැනීමටත් අවශ්‍ය පුහුණුව ලබාදෙනු ලැබේ.

අප අපෙගේ සේවාවන් සැපයීමේ දී හොඳම විද්‍යාත්මක පුහුණුව, හොඳම විද්‍යාත්මක දැනුම සහ සම්පත් භාවිත කරන්නෙමු. අපගේ සේවාවන් සැපයීමේ දී අත්දැකීම් ඇති අතිශයින්ම සුදුසුකම් ලබන විශේෂඥයින් සවිබල ගන්වමින් අපගේ සේවාවන් හොඳම ගුණාත්මක භාවය පවත්වාගෙන යති. ශ්‍රී ලාංකීය කර්මාන්තයන්හි අනාගත අභිවෘද්ධිය උදෙසා අත්‍යවශය වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ තත්ත්ව ආරක්ෂණ මෙහෙයුම් සේවා සපයනු ලබයි.

දේශීය කර්මාන්ත, සේවා යෝජකයින්, සේවකයින්, අන්තර්ජාතික සංවිධාන, විශ්වවිද්‍යාල සහ වෘත්තීය ප්‍රජාවන් සමඟ ගෝලීය සංකල්පවලට අනුකූලව සම්බන්ධතා ඇතිව කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය නියෝජනය කරන එකම රාජ්‍ය ආයතනයයි. තව ද අපි කර්මාන්ත, සේවා යෝජකයින් සහ අනෙකුත් පාර්ශවකරුවන් සමඟ කටයුතු කරන අතර ඔවුන් සමඟ සබඳතා පවත්වාගෙන යෑමට කටයුතු කරන්නෙමු.

**වෛද්‍ය එන්. සී. අමරසිංහ**
**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය**

## ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

අධ්‍යක්ෂක මණ්ඩල සමාජීකයින්



සභාපති

එස්. එම්. ජී. ජයරත්න මහතා

ලේකම්,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය

### සමාජිකයින්



චාන්දනී අමරතුංග මිය
කොමසාරිස් ජනරාල්
කම්කරු දෙපාර්තමේන්තුව



වෛද්‍ය එන්. සී. අමරසිංහ මිය

අධ්‍යක්ෂ ජනරාල්

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

රෝහිත ප්‍රනාන්දු මයා

කොමසාරිස් - කාර්මික සුවස්ථතා අංශය

කම්කරු දෙපාර්තමේන්තුව



මහාචාර්ය අජිත් ද අල්විස් මයා

රසායනික ඉංජිනේරු පීඨය

මොරටුව විශ්වවිද්‍යාලය



වෛද්‍ය ඉනෝකා සුරවීර
ප්‍රජා විශේෂඥ වෛද්‍ය
සෞඛ්‍ය අමාත්‍යාංශය



ආචාර්ය ඩබ්ලිව්. බී. විජේරත්න මයා


ආහාර හා කෘෂිකර්ම අමාත්‍යාංශය



පී. එම්. කේ. හෙට්ටිආරච්චි මයා
අධ්‍යක්ෂ
මුදල් අමාත්‍යාංශය

- එච්. එන්. පී. හෙට්ටිකන්දගේ මයා
- ඩබ්. ඩී. බී. වන්නිආරච්චි මයා
- ඩී. එම්. පී. බී. දිසානායක මයා
- ඩබ්. ඒ. ඩී. වී. කුමාර වීරසිංහ මයා
- එච්. අයි. රූපසිංහ මයා
- ඩී. ඩී. එස්. කේ. දසනායක මයා
- පී. බී. මල්ලවආරච්චි මයා

## සංවිධාන ව්‍යුහය


අධ්‍යක්ෂ ජනරාල්
අධ්‍යක්ෂ(සෞඛ්‍ය හා සුවස්ථතා)
අධ්‍යක්ෂ(සුරක්ෂිත තා)
සහකාර අධ්‍යක්ෂ (සෞඛ්‍ය)
සහකාර අධ්‍යක්ෂ (ස්වස්ථතා)
සෞඛ්‍ය හා සුරක්ෂිතතා නිලධාරි
වෘත්තීය සුරක්ෂිතතා නිළධාරි
සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)
සහකාර අධ්‍යක්ෂ (මුදල්)
සහකාර අධ්‍යක්ෂ (සිවිල්)
සහකාර අධ්‍යක්ෂ කාර්මික
සහකාර අධ්‍යක්ෂ (ඉලෙක්ට්‍රිකල් හා ඉලෙක්ට්‍රොනික්)
නීති සම්පාදක නිළධාරි
පුස්තකාලාධිපති
සම්බන්ධීකරණ නිලධාරි
කලමණාකරණ සහකාර තාක්ෂණිකl (2)
රියදුරු(2)
කාර්යාල සහයක (3)
කලමණාකරණ සහකාර තාක්ෂණික නොවන (8)

## පරිච්ඡේදය 2

### ජාතික වෘත්තීය සුරක්ෂිතතා ආයතනයේ පොදු අරමුණු

1. ශ්‍රී ලංකාවේ හෝ විදේශීය විශ්වවිද්‍යාලයක් සමග සහයෝගීතාවයෙන් හෝ ආයතනය විසින් වෘත්තීය ආරක්ෂණය හා සෞඛ්‍ය පිළිබඳව සහ දැනුම, පුහුණුව ලබාගැනීමට අපේක්ෂාවෙන් සිටින සේවා නියුක්තිකයන්ට, නිවැසියන්ට, සේවකයන්ට හෝ වෙනත් යම් තැනැත්තෙකුට දැනුවත් කිරීම හා අවශ්‍ය පුහුණුව ලබාදීම සහ එකී පුහුණුව හෝ දැනුවත් කිරීමේ වැඩසටහන සම්පූර්ණ කිරීමෙන් පසුව සහතික පත්‍ර හෝ ඩිප්ලෝමා සහතික ප්‍රදානය කිරීම.

2. උපකරණ, අනතුරුදායක ද්‍රව්‍ය, භෞතික, රසායනික හෝ ජීව විද්‍යාත්මක ද්‍රව්‍ය හෝ නිෂ්පාදන හෝ වෙනත් යම් යම් අනතුරුදායක ද්‍රව්‍ය නිවැරදිව භාවිතකරන ආකාරය හා හඳුනාගත් අනතුරුවලින් වැළකීම පිළිබඳ අවශ්‍ය උපදේශන සහ ප්‍රායෝගික සේවාවන් සැපයීම

   (1) වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය සම්බන්ධයෙන් ප්‍රමිතින්, නීති සැපයීම, පුහුණු සහ මාර්ගෝපදේශ සම්බන්ධයෙන් ව්‍යවස්ථාමය නියමයන් පිළිබඳ අමාත්‍යවරයාට උපදෙස් ලබාදීම.

   (11) වැඩ පිළිබඳ සීමා කිරීමකට, තහනමකට සීමා කිරීමකට හෝ අධීක්ෂණයකට යටත් කරනු ලැබිමකට නිරාවරණය වන්නාවූ ද්‍රව්‍ය සහ කාරක ඇගැයීම හා නිශ්චය කිරීම.

3. වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍යය පිළිබඳ තොරතුරු රැස් කිරීම, සකස් කිරීම, බෙදා හැරීම සහ ප්‍රසිද්ධ කිරීමේ කටයුතු සිදුකිරීමට භාර ගැනීම සහ එයට සහයෝගය දැක්වීම.

4. ශාස්ත්‍රීය සම්මන්ත්‍රණ, දේශණ, වැඩමුළු, සම්මන්ත්‍රණ වැනි වැඩසටහන් සංවිධානය කිරීම හෝ එවැනි වැඩසටහන්වලට අනුග්‍රහය දැක්වීම සහ වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍යය පිළිබඳ ලිපි පල කිරීම.

5. වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ අන්තර් අමාත්‍යාංශ ව්‍යාපෘති, වැඩසටහන් හා ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම.

6. වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය වැඩිදියුණුකරමින් පුහුණු කටයුතු ප්‍රවර්තනය උදෙසා පුස්තකාල සහ රසායනාගාර ස්ථාපිතකර පවත්වාගෙන යෑම.

7. පර්යේෂණාගාර හා විශේෂ රසායනාගාර වැඩිදියුණු කිරීම.

8. වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාල ජාතික හා ජාත්‍යන්තර ආයතන, විශ්වවිද්‍යාල, හෝ වෙනත් වෘත්තීය සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළ ආයතන සමඟ ජාල පිහිටුවීම.

9. වෘත්තීය සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළ ජාතික ප්‍රමිතින් සකස් කිරීම.

## 2016 වර්ෂය තුළ අපගේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා NIOSH හි උපාය මාර්ග

- වෘත්තීය සෞඛ්‍ය ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම හා කාලීනව යාවත්කාලීන කිරීම සඳහා රජයට උපදෙස් දීම.
- රසායනික භාවිතය, ඉදිකිරීම් කටයුතුවල ආරක්ෂාව, වෘත්තීය අනතුරු හා රෝග වැළැක්වීම, පාරිසරික ආරක්ෂාව, අපද්‍රව්‍ය කළමණාකරණය හා ආතතිය කළමනාකරණය වැනි ඉලක්කගත වැඩසටහන් ඔස්සේ වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ දැනුවත් කිරීම් වැටසටහන් පැවැත්වීම මගින් වෘත්තීයම අබාධ හා රෝග අවම කිරීම සඳහා කර්මාන්තයන්ට සහාය වීම.
- වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය අවධානම ඇගයීම සිදු කිරීම මගින් වැඩ පරිසරය වැඩිදියුණු කිරීම සඳහා කර්මාන්තයන්ට සහය වීම සහ වැඩිදියුණු කිරීම් සඳහා උපදෙස්, විසඳුම් සහ නිර්දේශ සැපයීම.
- පර්යේෂණ හා සංවර්ධන අරමුදල් ඇති කිරීම, ශක්තිමත් පර්යේෂණ කණ්ඩායමක් සැකසීම, වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය සම්බන්ධ පර්යේෂණ හා සමීක්ෂණ පැවැත්වීම, පර්යේෂණ පත්‍රිකා ප්‍රකාශයට පත්කිරීම සහ දේශීය සහ විදේශීය විශ්වවිද්‍යාල සමඟ සම්බන්ධ වී පර්යේෂණ සිදු කිරීම සඳහා වෘත්තීය සුරක්ෂිතතා සෞඛ්‍ය ආයතනය මඟින් මඟ පෙන්වීම සිදුකරනු ලැබේ.
- වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ කර්මාන්ත ක්ෂේත්‍රයේ ඇති හොඳ පුරුදු ඇගයීමට හා ඇගයීම සඳහා දෙවන ජාතික වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය සම්මාන තරගාවලිය සංවිධානය කිරීම හා වසර දෙකකට වරක් සම්මාන උළෙල සංවිධානය කිරීම.
- දෙවන ජාතික වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය විශිෂ්ඨතා සම්මාන උළෙල සංවිධානය කිරීම හා නැවත වෘත්තීය සුරක්ෂිතතා සෞඛ්‍ය කර්මාන්තයේ හොඳම ක්‍රියාකාරි භාවිතයන් ඇති ආයතනය ඇගයීමට ලක් කිරීම.
- දැනුවත්භාවය වර්ධනය කිරීම සහ වෘත්තීය සුරක්ෂිතතාව පිළිබඳ වෘත්තීයවේදීත්වය වෘත්තීයමභාවය ශක්තිමත් කිරීම සඳහා විවිධ පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- ජාතික වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය ප්‍රමිති හා රෙගුලාසි සංවර්ධනය කිරීම.
- ඕනෑම භෞතික රසායනික හා ජීව විද්‍යාත්මක කාරක හෝ නිෂ්පාදන වලින් සේවකයන් ආරක්ෂා කිරීම සඳහා පෞද්ගලික ආරක්ෂක උපකරණ නිසි ලෙස භාවිතය පිළිබඳ ප්‍රායෝගික ප්‍රදර්ශන පැවැත්වීම.
- 2016 වර්ෂයේ පැවති ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය සම්මන්ත්‍රණය සඳහා නියෝජිතයින් 450කට අධික සංඛ්‍යාවක් සහභාගී වීම.

# 2016 වර්ෂය තුළ ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය විසින් පවත්වනු ලැබූ වැඩසටහන් හා ක්‍රියාකාරකම්.

1.පුහුණුකිරීම්

| පුහුණු මට්ටම | පාඨමාලාව | පුහුණුවීම් කාලය |
|---|---|---|
| ප්‍රවේශ මට්ටම | පාසල් හැර ගිය අය සඳහා වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පුහුණු පාඨමාලාව | |
| පළමු මට්ටම | බොයිලේරු ක්‍රියාකරවන්නන් සඳහා වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පුහුණු පාඨමාලාව<br><br>කාර්මික ආරක්ෂක ප්‍රවර්ධන පුහුණු පාඨමාලාව<br><br>කර්මාන්ත ආශ්‍රිත සේවයේ නියුතු හෙදියන් සඳහා හෙඳ පුහුණු පාඨමාලාව<br><br>කාර්යාලයන්හි සේවයේ නියුතු කාර්යමණ්ඩලය සඳහා වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පුහුණු පාඨමාලාව<br><br>විද්‍යාගාර සේවකයන් සඳහා වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පුහුණු පාඨමාලාව<br><br>ආරක්ෂිතව රසායනික කටයුතු මෙහෙයවීමේ පුහුණු පාඨමාලාව<br>ආහාර කළමනාකරණය සඳහා වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පුහුණු වැඩසටහන<br><br>සේවක හා සේවායෝජකයන් සඳහා ආතති කළමනාකරණ පුහුණු වැඩසටහන | |
| දෙවන මට්ටම | වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | මාස 06 |
| තෙවන මට්ටම | වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | අවුරුද්දයි |

2. පාරිසරික සමීක්ෂණ

- වාතයේ තත්ත්වය සමීක්ෂණය කිරීම සඳහා Indoor Air Quality උපකරණ භාවිත කිරීම
- දුම් පරීක්ෂා කිරීම සඳහා Flu Gas Analyser meter උපකරණ භාවිත කිරීම
- කර්මාන්ත තුළ දූවිලි මට්ටම් සමීක්ෂණය කිරීම හා දූවිලි පොම්ප උපකරණ භාවිත කිරීම
- ඝෝෂා මට්ටම සමීක්ෂණය කිරීම හා ශබ්ද මැනීම Sound Level Meter උපකරණ භාවිත කිරීම
- උෂ්ණත්වයේ මට්ටම සමීක්ෂණය කිරීම හා WBGT භාවිත කරමින් උෂ්ණත්ව නිරීක්ෂණය

3. වැඩ ඇගයීම සඳහා වෛද්‍ය පරීක්ෂණ

- ශ්‍රවණ තත්ත්ව මැනීමේ පරීක්ෂණ
- රුධිර විශ්ලේෂණය
- පෙනහළු ක්‍රියාකාරිත්වය පිළිබඳ පරීක්ෂණ
- දෘෂ්ටි පරීක්ෂණ


# 2016 වර්ෂයේ පැවැත්වූ පාඨමාලා, වැඩමුළු හා සම්මන්ත්‍රණ

## *පළමු මට්ටමේ පුහුණුව*

### කර්මාන්ත ක්ෂේත්‍රයේ හෙදියන් සඳහා වූ පුහුණුව

වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතනය වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීමේ අරමුණින් කර්මාන්ත ක්ෂේත්‍රයේ රැකියාවේ නියුතු හෙදියන් සඳහා මෙම පුහුණු පාඨමාලාව ආරම්භකර ඇත. මෙම පුහුණුව මගින් ආවරණය කරනු ලබන විෂයක්ෂේත්‍රය වනුයේ අනතුරක් වීමට පෙර අවධානම් හඳුනාගැනීම, සාකච්ඡාමය කුසලතා වර්ධනය කරගැනීම, හදිසි අනතුරු දැනුම් දීමේ ආකාරය පිළිබඳ දැනුවත් කිරීම හා එය වාර්තාකර දත්ත පදනම හැසිරවීම පිළිබඳ යනාදී ප්‍රායෝගීක කරුණු පිළිබඳව පුළුල් පුහුණුවක් ලබාදෙනු ලැබේ. මෙහි ඉගැන්වීම විශේෂයෙන් නිර්මාණය කර ඇත්තේ, දත්ත සහ තොරතුරු මත පදනම්ව වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ තීරණ ගැනීමය. මෙම පාඨමාලාව දින 05ක් පැවැත්වූ අතර සහභාගි වූ පිරිස් ඇගයීමට ද ලක් කෙරුණි. එමෙන්ම සාර්ථක පුහුණු පාඨමාලාවක් ද විය.

### සුපරීක්ෂකවරුන් / තත්ත්ව පරීක්ෂකවරුන් සඳහා වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ එක්දින වැඩමුළුව



**ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සුපරීක්ෂකවරුන් සඳහා දින තුනක පුහුණුව**

මෙම වැඩමුළුව ඉදිකිරීම් කර්මාන්තයේ සුපරීක්ෂකවරුන් සඳහා විශේෂයෙන් අවධානය යොමුකර සකසන ලද පුහුණුවකි. සාප්පු සංකීර්ණ සේවකයින්ගේ හොඳම කාර්ය සාධනය හා වෘත්තීය සෞඛ්‍ය සුරක්ෂිතතාව නගා සිටුවීමේ අරමුණින් මෙම පුහුණුව දින තුනක් ඇතුළත නිමකරන ලදී. මොවුන් මෙම පුහුණුව මගින් ලබාගත් අවදානම් තක්සේරු පිළිබඳ අත්දැකීම් ලබාගත් අතර පුද්ගලික ආරක්ෂණ උපකරණ නිසිලෙස භාවිත කිරීම පිළිබඳව පුහුණුවීම් කළහ.



**පාරිසරික ආරක්ෂාව සහ අපද්‍රව්‍ය කළමනාකරණ පුහුණුව**

ශ්‍රී ලංකාවේ පාරිසරික රැකවරණය හා සම්බන්ධ නීති සම්පාදනය සහ ශ්‍රී ලංකාවේ දැනට පවත්නා ප්‍රායෝගික අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රමවේදය මත පුහුණුවක් ලබාදීම සඳහා කර්මාන්තයන්ගේ ඉල්ලීම මත මෙම පුහුණුව නිර්මාණය කර ලබාදෙන ලදී. ඒ අනුව, අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ සහ පාරිසරික අධිකාරියේ සම්පත් දායකයින්ට පුහුණු සැසි පැවැත්වීම සඳහා ආරාධනා කරන ලදී. NIOSH ප්‍රධාන පුහුණු සංවිධායක ලෙස, වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය පිළිබඳ විශේෂ දේශන ලබාදුන් අතර, විවිධ වර්ගයේ අපද්‍රව්‍ය හසුරුවන පුද්ගලික ආරක්ෂක උපකරණ භාවිතය පිළිබඳ ප්‍රායෝගික පුහුණු සැසි කිහිපයක් පවත්වනු ලැබීය.

**ඉදිකිරීම් ආරක්ෂක පුහුණුව**

ACCESS හි සේවයේ නියුතු ඉංජිනේරු කාර්ය මණ්ඩලය සඳහා NIOSH විසින් සංවිධානය කරන ලද විශේෂ පුහුණුවකි. මෙම පුහුණුව සඳහා සහභාගි වූ අය, අධීක්ෂකවරුන් වූ අතර පුහුණුවේ අරමුණ වූයේ, ඔවුන්ගේ අධීක්ෂණය කිරීමේ ධාරිතාව වැඩිදියුණු කිරීමත්, වෘත්තීය සුරක්ෂිතාව හා සෞඛ්‍ය පිළිබඳ අවබෝධය හා පුහුණුව ලබාදීමත්ය. ඔවුන්හට වෘත්තීය සෞඛ්‍ය සුරක්ෂිතාව පිළිබඳව ඉගෙනීමට හැකි වූ අතර, ඔවුන් සතු කුසලතා අභිප්‍රේරණය කරමින් වර්ධනය කරගැනීමට හැකියාව ලැබීය.

**ආතති කළමනාකරණ පුහුණු වැඩසටහන**

මෙම පුහුණු වැඩසටහන දින දෙකක් තිස්සේ ඉදිරියට ගෙන ගිය අතර පෞද්ගලික මානසික ආතතිය හා මානසික ආතති කළමනාකරණය සඳහා හේතු හඳුනා ගැනීම සඳහා ප්‍රායෝගික ක්‍රමවේදයන් පිළිබඳව විශේෂයෙන් අවධානය යොමුකරන ලදී. විශේෂයෙන්ම උපදේශන කටයුතුවලදී සහභාගී වූ පිරිසට ඇසට ඇසක් මුණ ගැස්විමේ සැසියක් වූ අතර ආතතිය කළමනාකරණය තාක්ෂණ ක්‍රමයේ වැදගත්කම අවධාරණය කරන ලදී.

**විදුලි ආරක්ෂණ පුහුණු වැඩසටහන**

නොවැම්බර් 03 සහ 04යන දෙදිනයන්හි වැඩමුළුවක් NIOSH හි පවත්වන ලද අතර එහි දී ආරක්ෂිතව විදුලි වැඩ සිදුකරන ආකාරය පිළිබඳ විදුලි කාර්මිකයන්ගේ කුසලතා වර්ධනය කිරීම සිදුකරන ලදී. මෙම පුහුණු වැඩසටහනට 41 දෙනෙකු සහභාගි වූ අතර ඔවුන් විවිධ කර්මාන්ත නියෝජනය කරන ලදී. එම කර්මාන්ත නම්,

- කෝග්ගල ගාමන්ට්ස් (පුද්) සමාගම
- ඩීසල් සහ මෝටර් ඉංජිනේරු සමාගම
- DSI පාවහන් සමාගම
- ඔරිට් ඇපරල්ස් ලංකා පුද්ගලික සමාගම ආදි වශයෙනි



**බොයිලේරු ක්‍රියාකරවන්නන් පුහුණු කිරීම**

බොයිලේරු ක්‍රියාකරුවන් පුහුණු කිරීම බොහෝ කර්මාන්ත ශාලාවල ඉල්ලීම අනුව පවත්වන ලද අතර ආරම්භක වැඩසටහනක් ලෙස කිහිපදෙනෙකු සහභාගි විය

***දෙවන මට්ටමේ පුහුණුව***

**වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍යය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව**

2016 වර්ෂයේ දී වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවන් තුනක් සාර්ථක ලෙස පවත්වන්නට යෙදුනි. එක් එක් පුහුණු පාඨමාලාවේ කාලය සති 15ක් වන අතර එක් එක් පාඨමාලාව සඳහා සිසුන් 17ක් සහ 25දෙනෙකු සහභාගි විය. මෙම සියලු සිසුන් සාර්ථකව පුහුණුව අවසන්කර 2016 ඔක්තෝම්බර් මස 16වන දින උපාධි ප්‍රදානෝත්සවය පවත්වන ලදී. මෙම පුහුණුව ලැබුවන් සියලු දෙනා පුහුණුව ලැබූ ආයතන අධීක්ෂණය කරන ලද අතර, ඔවුන්ගේ සේවා ස්ථානවල වෘත්තීය අනතුරු අවම කිරීම සඳහා ඔවුන් විශාල දායකත්වයක් ලබාදෙයි. එමෙන්ම වෘත්තීය අනතුරු අවම කර ගැනීමට පිටුවහලක් වී ඇත. මේවන විට වැඩි ප්‍රමාණයක් සුරක්ෂිතතා නිලධාරීන් ලෙස දැනට සේවයේ යෙදී සිටිති. අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ සුදුසුකම් ඇති, වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය පිළිබඳ උනන්දුවක් දක්වන ඕනෑම අයෙකුට මෙම පාඨමාලාව හැදෑරිය හැක. යුධ හමුදාවේ ඉල්ලීම මත අප 2016 දෙසැම්බර් මාසයේ දී සමාජිකයින් 30 දෙනෙකුගෙන් යුත් සහභාගීත්වයෙන් විශේෂ සහතික පත්‍ර පාඨමාලාවක් ආරම්භකරන ලදී.






සතියේ දින සහතික පත්‍ර පාඨමාලාව (16වන කණ්ඩායම) 2016.01.13





සති අන්ත පාඨමාලාව (19 වන කණ්ඩායම) 2016.08.20





***තුන්වන මට්ටම - පුහුණු කිරීම.***

**1. වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව**

වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවන් තුනක් 2016 වර්ෂයේ දී පවත්වන ලදී. කණ්ඩායම් දෙකක් පැවැත්වීමට සැලසුම්කර තිබුණද පාඨමාලාවන් තුනක් පැවැත්වීම සිදු වූ අතර, තරඟකරුවන් තෝරාගැනීමේ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමෙන් අනතුරුව කණ්ඩායම් 10,11 සහ 12 කණ්ඩායම් තුන සඳහා පාඨමාලා ආරම්භකරන ලදී. පෙබරවාරි සහ මාර්තු මාසයන්හි මෙම පාඨමාලා ත්‍රිත්වයේ ආරම්භය සිදු වූ අතර මාර්තු සහ සැප්තැම්බර් මාසයන්හි විවිධ ක්ෂේත්‍රයන් නියෝජනය කරමින් විධායක නිලධාරින් පිළිවෙළින් 34ක් හා 37ක් වන පරිදි සහභාගි විය.

වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය සම්බන්ධ කර්මාන්ත අවශ්‍යතා හා එම අවශ්‍යතා තක්සේරු කිරීමෙන් පසු වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව සකස්කරන ලදී. ඒ අනුව මෙම පාඨමලාව සඳහා මොඩියුල තුනක් සකස් කරන ලදී. එනම්, වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය කළමනාකරණ මොඩියුලය, වෘත්තීය ආරක්ෂණ මොඩියුලය සහ වෘත්තීය සෞඛ්‍ය මොඩියුලය ත්‍රිත්වයෙන් යුක්ත වේ. එක් මොඩියුලයක් අවසානයේ මොඩියුල විභාගයක් පැවැත්වේ. මෙම විභාගයෙන් පසුව තමා ලබාගත් දැනුම හා කාර්මික අත්දැකීම් මත ව්‍යාපෘති වාර්තාවක් අවසන් විභාගයට පෙර ලබාදිය යුතුය.

අප විසින් මෙම පාඨමාලාව සඳහා න්‍යායාත්මක මෙන්ම ප්‍රායෝගික දැනුම ලබාදෙන අතර ඒ සඳහා එම කණ්ඩායම් ක්ෂේත්‍ර චාරිකාවන් දෙකක් සඳහාද සහභාගි කරවීම මෙම පාඨමාලාවේ තවත් අංගයකි. ඒ සඳහා මෙම වසරේ පාඨමාලාවේ සිසුන් Loard star පෞද්ගලික ආයතනය, කොළඹ ඩොක්යාර්ඩ් ආයතනය, Brandix ආයතනය සහ යුනිලීවර් යන ආයතනයන් ක්ෂේත්‍ර චාරිකාව සඳහා යොදාගන්නා ලදී.

මෙම පාඨමාලාව හැදෑරීම තුලින් ලද පුහුණුවෙන් තම සේවා ස්ථානවල වඩාත් සුරක්ෂිත වැඩබිමක් නිර්මාණය කර ගැනීමට ඔවුනට හැකියාවක් ලැබෙන අතර මෙම පුහුණුව තුළින් වැඩකරන සේවකයන්ගේ ආරක්ෂාවට මනා පිටුවහලක් වී ඇත.

2016 වර්ෂයේ ඔක්තෝම්බර් මස 16 වන දින කොළඹ ගලධාරි හෝටලයේ ප්‍රධාන ශාලාවේ දී ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය විසින් සංවිධානය කරන ලද ඩිප්ලෝමා ප්‍රධානෝත්සවය සාර්ථකව අවසන් කරන ලදී.






කර්මාන්තයන්හි ඉල්ලීම්වලට අනුව NIOSH විසින් අවශ්‍ය පුහුණුව ලබාදෙන අතර, අපගේ පුහුණුව ලත් වෘත්තීය සුරක්ෂිතතා නිලධාරීන් මෙම පුහුණුවට ඔවුන්ගේ වටිනා දායකත්වය සපයනු ලබයි. එසේම මෙම පාඨමාලාව හැදෑරීමෙන් පසු විදේශ රැකියාවලට යොමුවීම සඳහා සුදුසුකමක් වන අතර මේවන විටත් පාඨමාලාව සාර්ථකව නිමකළ සිසුන් විදේශ රටවල සේවා නියුක්තව සිටියි. පාඨමාලාව සාර්ථකව නිමකරන සිසුන් සඳහා NVQ 6 සුදුසුකම් සහිත සහතිකපතක් ද ලබාදෙනු ඇත.

**මෙම වසරේ පවත්වන ලද පුහුණු වැඩමුළු**

**සම්මාන උළෙල පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණු සැසිය**

ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය විශිෂ්ඨතා සම්මාන උළෙල සඳහා සහභාගී වීමට අවශ්‍ය ඕනෑම කර්මාන්තයකට විශේෂ පුහුණුවක් ලෙස මෙම දැනුවත් කිරීමේ පුහුණු සැසිය 2016 වර්ෂයේ දී පැවැත්වීය. 2016 වර්ෂයේ මාර්තු මස මෙම පුහුණු පාඨමාලාව පවත්වන ලද්දේ විශිෂ්ටතා සම්මාන තරඟාවලිය සඳහා සූදානම් වීම සඳහාය. විශාල කර්මාන්ත ගණනාවක් මෙම පුහුණු වැඩමුළුව සඳහා සහභාගි විය. සහභාගි වූ පිරිස අසනු ලැබූ ප්‍රශ්න සඳහා විශේෂඥ කමිටුව අවශ්‍ය විසඳුම් හා පිළිතුරු ඉතා සාර්ථක ලෙස ලබාදෙනු ලැබීය. ක්ෂේත්‍ර සත්‍යාපනය සාර්ථකව නිම කිරීමට මෙමගින් හැකියාව ලැබුනි.

## *ජාතික සම්මන්ත්‍රණය සහ දැනුවත් කිරීමේ වැඩසටහන*

**සුරක්ෂිතතා සතිය - ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන**

වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය ආයතනය 2009 අංක 38 දරණ පනත මගින් ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස එහි අරමුණු වලින් එකක් ලෙස වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය පිළිබඳ ජාතික ව්‍යාපාරය සංවිධානය කරන ලදී. ඒ අනුව NIOSH විසින් විවිධ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සාමාන්‍ය ජනතාවගේ හා වැඩකරන ශ්‍රම බලකායේ ආරක්ෂාව උදෙසා විවිධාකාරි වූ වැඩසටහන් සංවිධානය කරන ලදී.

තේමාවː- වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතතාවයෙහි නැගී එන අවධානම් අඩු කිරීම.

වෘත්තීය සුරක්ෂිතතා සතිය සැමරීම සඳහා සකස්කරන ලද විශේෂ සංකේතය




**ජාතික වෘත්තීය සුරක්ෂිතතා සතිය අරම්භයට පෙර පැවති පුවත්පත් සාකච්ඡාව**

වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ විශේෂ පණිවුඩය ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් සංවිධානය කරන ලදී. රටේ ආරක්ෂාව සහ සෞඛ්‍ය පිළිබඳව, කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගරු ඩබ්ලිව්. ඩී. ජ්. සෙනෙවිරත්න ඇමත්‍යතුමා සිය කැපවීම සහ අමාත්‍යංශයේ කැපවීම සහතික කර තිබේ.

**6වන ආසියානු වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පර්යේෂණ ආයතනයේ රැස්වීම (AOSHRI)**

2016 වර්ෂය NIOSH සඳහා සුවිශේෂි අවුරුද්දක් විය. එනම් NIOSH විසින් සංවිධානය කරන ලද ශ්‍රී ලංකාවේ ප්‍රථම ජාත්‍යන්තර වෘත්තීය සෞඛ්‍ය සුරක්ෂිතතා රැස්වීම පැවැත්වීමය. 2016 ඔක්තෝම්බර් මස 09 වන දින වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පර්යේෂණ ආයතනයේ රැස්වීම පැවැත්වීම. ආසියානු සහ සාක් රටවල් ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය විශේෂඥයින් 20කට අධික පිරිසක් මෙම සැසිවාරයට සහභාගි වූ අතර AOSHRI කණ්ඩායම විසින් තාක්ෂණික වාර්තාවක් ලෙස මාර්ග සිතියමක් සංවර්ධනය කරන ලදී. මෙම වැඩමුළුව දින තුනක් සඳහා පවත්වන ලද අතර, වැඩමුළුව තුළදී බුද්ධිවර්ධනය පිළිබඳ විශේෂ මාතෘකා පිළිබඳව අවධානය යොමුකිරීමත් කලාපය තුළ ඇතිවන අවධානම් තත්ත්වයන් අවධානම ලෙස සැලකිය යුතු මාතෘකා පිළිබඳවත් මෙහිදී අවධානය යොමුකරන ලදී.









අවසන් ප්‍රතිඵලය ලෙස සවිස්තරාත්මක වාර්තාවක් සහිත රැස්වීමක් විකාශනය කරන ලදී.

මෙම සැසිය සඳහා සහභාගි වූ පිරිස කොළඹ නගරයේ සංචාරයක නිරත වූ අතර කොළඹ දී සාප්පු සවාරි සඳහා ද ඔවුන්ගේ කාලය වෙන්කරන ලදී. කොළඹ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ දී ඔවුන් සඳහා ම වෙන් වූ විශේෂ මෙරටට අවේනික වූ නර්තනයක් සහ දේශීය ආහාර වේලකින් යුක්ත විශේෂ රාත්‍රී හොජන සංග්‍රහයක් සමන්ත්‍රණය අවසන් දිනයේ දී සංවිධානය කර තිබුණි.



## ජාතික වෘත්තීය සුරක්ෂිතා හා සෞඛ්‍ය සමුළුව 2016

වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ජාතික සම්මන්ත්‍රණය 2016 ඔක්තොම්බර් මස 12වන දින කොළඹ ගලධාරි හෝටලයේ දී පැවැතවිණි. මෙම සම්මන්ත්‍රණය වාර්ෂිකව පවත්වනු ලබන අතර ඒ සඳහා ශ්‍රී ලාංකික සේව්‍ය සේවක දෙපාර්ශවයම නියෝජනය කරමින් 500කට නොවැඩි කර්මාන්ත හිමියන්, සුරක්ෂිතතා නිලධාරින් සහභාගි විය.

මෙම සමුළුව සඳහා සහභාගී වූ සියලුම ජාත්‍යයන්තර නියෝජිතයින්ට වාර්ෂිකව පවත්වන සමුළුව ඉතා සුවිශේෂ වූ අතර, AOSHRI සංවිධානයේ සභාපති ආචාර්ය ගැන් මහතා විසින් සිංගප්පූරුවේ AOSHRI රැස්වීම මගින් ඉදිරිපත්කරන ලද වෘත්තීය සෞඛ්‍ය සුරක්ෂිතතාවයෙහි ඇති වැදගත්කම පිළිබඳව ශ්‍රී ලංකාවේ පැවති සමුළුවේ හි ද, අන්තර්ජාතික වශයෙන් අවධානරණය කරන ලදී. එහිදි දේශීය විදේශීය සම්පත් දායකයින්ගේ හරවත් දේශන තුළින් තාක්ෂණික දැනුම ලබා දී ඇත.

NIOSH සැම විටම උත්සහා කරනු ලබන්නේ නව නැගී එන හා යළි ඇති වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය ගැටලු නිරාකරණය කිරීමට උත්සාහ කිරීම හා නැවත එම ගැටලු නොනැගී එන ආකාරයට නිරාකරණය කිරීමය. එමෙන්ම, ගෝලීය වෘත්තීය සෞඛ්‍ය සුරක්ෂිතතාවයෙහි දක්නට ලැබෙන ගැටලු පිළිබඳ නව සංකල්ප හා සිතුවිලි හඳුනාගැනීමටත්, අපගේ කර්මාන්ත ප්‍රජාව අතර වෘත්තීය සෞඛ්‍ය සුරක්ෂිතතා දැනුම හුවමාරු කර ගැනීමටය. ඒ සඳහා මැලේසියාව, සිංගප්පූරුව සහ කොරියාවෙහි මෙම විෂය පරිපථය පිළිබඳ මනා දැනුමක් ඇති හොඳම කථිකයින් මෙයට සහභාගි විය.

### ඩිප්ලෝමා සහතිකපත් ප්‍රධානෝත්සවය

වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව ඉතාමත් සාර්ථක ලෙස නිමකරන ලද විධායක ශ්‍රේණියේ රැකියාවල නියුතු හා නියැලීමට බලාපොරොත්තුවන සුරක්ෂිතතා නිලධාරින් සඳහා ඩිප්ලෝමාධාරින් ලෙස සහතික පත් ලබාදීමේ ඩිප්ලෝමා ප්‍රධානෝත්සවය මෙම වසරේ ඔක්තෝම්බර් 14වන දින ගාලුමුවදොර පිහිටි ගලධාරි හෝටලයේ ප්‍රධාන ශාලාවේ දී ඉතා උත්කර්ෂවත් අන්දමින් සිදුකරන ලදී. එමෙන්ම වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව සාර්ථක ලෙස නිමකල සිසුන් සඳහා ද සහතික පත් ප්‍රධාන කල අතර ඩිප්ලෝමා පාඨමාලා හා සහතික පත්‍ර ලාභින් 70කට නොඅඩු පිරිසක් සහභාගි විය.

මේ සඳහා කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය ගරු ලේකම්තුමා විසින් ප්‍රධානත්වය ගනු ලැබීය. මීට අමතරව අප ආයතනය සමඟ කටයුතු කරන සමාගම් කිහිපයකම කළමණාකරුවන් කිහිප දෙනෙකුගේම සහභාගිත්වය මේ සඳහා ලැබුණි. මෙම උත්සවයේ කැපී පෙනෙන අංගයක් වූයේ ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය විසින් පවත්වන්නට යෙදෙන පාඨමාලාවන් සඳහා සම්පත් දායකත්වය ලබාදෙන දේශකවරුන් ඇගයීමට ලක් කිරීමට අවස්ථාවක් කරගත් බැවිනි.


Emerging Risks
and Investing on


International
Safety
Honeywell







**ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය විශිෂ්ටතා සම්මාන ප්‍රධානය**

ජාතික ආරක්ෂාව හා සෞඛ්‍ය විශිෂ්ඨතා සම්මාන උළෙල 2014 වර්ෂයේ දී අපගේ නව වැඩසටහන් වලින් එකක් ලෙස ආරම්භ කරන ලදී. 2016 වර්ෂයේ දී ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය විශිෂ්ඨතා සම්මාන ප්‍රදානෝත්සවය සැලසුම් කළ අතර ජයග්‍රාහකයින් තෝරාපත්කර ගැනීමේ අදියර තුනකින්ද සමන්විත විය. එනම්,

1. තහවුරු ලිපිලේඛන සමඟ අයදුම්පත ඉදිරිපත් කිරීම.

මෙම ලිපිලේඛණ ඉදිරිපත් කිරීම සඳහා මාස තුනක කාලයක් ලබාදෙන ලදී.

2. ක්ෂේත්‍රයේ සිටින වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ විශේෂඥ මණ්ඩලයක් විසින් අයදුම්පත් සමාලෝචනය කිරීම

3. විශේෂයෙන්ම සැලසුම්කල මෘදුකාංගයක් භාවිත කරමින්, විශේෂඥ මණ්ඩලයක් විසින් ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කීරීම. මෙම ක්ෂේත්‍ර පරීක්ෂණය සිදු කිරීම දිනකට පෙර දැනුම් දෙන ලදී.

ක්ෂේත්‍ර පරීක්ෂණය සිදු කිරීමේ දී තාක්ෂණික විශේෂඥයින් පස් දෙනෙකුගෙන් සැදුම්ලත් හයදෙනෙකුගෙන් යුක්ත වූ අතර සම්මාන තේරීමේ ක්‍රමවේදය හා ප්‍රතිපත්ති පිළිබඳව ඔවුන් දැනුවත් කරන ලදී. දෝෂයන් අවම කිරම අඩු කර ගැනීමට මේ සඳහා මෘදුකාංග භාවිතා කරනු ලැබීය.

විවිධ කර්මාන්ත කාණ්ඩ වලින් 32ක් තෝරාගෙන ඇත. සම්මාන ප්‍රධානෝත්සවය "නෙළුම් පොකුණ" කලා ප්‍රසාංගික රංගශාලාවේ දී අගමැති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.




**කර්මාන්ත සඳහා වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ කර්මාන්තයන් සඳහා උපදේශන සේවාව**

වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය කලමණාකරණ පද්ධති සංවර්ධන සඳහා උපදේශන සේවා සැපයීම ද අප ආයතනය විසින් සිදු කරනු ලබයි. මෙම සේවාව සපයනු ලබන්නේ ආයතනයන්හි ඉල්ලීම්වලට අනුකූලවය.

**උපකරණ නිවැරදි භාවිතය පිළිබඳව උපදේශන සේවාව සැපයීම**

ඊකියා පිරිවිතරයන්ට අනුව පුද්ගල ආරක්ෂක උපකරණ නිසි භාවිතය පෙන්නුම් කිරීමට අවශ්‍ය මිනිස් ආකෘතින් සංවර්ධනය සහ මෙම පෞද්ගලික ආරක්ෂක උපකරණ නිසි භාවිතය පිළිබඳ සේවකයන් සඳහා පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමද අප ආයතනය විසින් සිදු කරනු ලබයි.





**වැඩ කිරීමට යෝග්‍යතාව - නොමිලේ වෛද්‍ය කඳවුරක් පැවැත්වීම**

MIDAS ආයතනය විසින් අධාර ලබාදෙනු ලැබීය - 2016 ජුනි 03






වැඩ කිරීම සඳහා යෝග්‍යතාව වර්ධනය කර සේවකයින්ගේ සෞඛ්‍ය තත්ත්වය වැඩිදියුණු කිරීම අපගේ උපාය මාර්ගවලින් එකකි. බියගම කර්මාන්ත කලාපය මෙම ගංවතුර තත්ත්වයට ගොදුරු විය.

2016 වර්ෂයේ දී ශ්‍රී ලංකාව විවිධ වූ ස්වභාවික විපත්වලට ගොදුරු වූ අතර බොහෝමයක් වැඩකරන්නන් මෙම ගංවතුර තත්ත්වයට මුහුණ දීම නිසාවෙන් දැඩි ලෙස පීඩාවට පත්විය. අප ආයතනයේ සහාය ඔවුනට අවශ්‍ය වූ බැවින් NIOSH විසින් වෛද්‍ය ආධාර ලබාදීම සඳහා වෛද්‍ය කඳවුරක් එම ස්ථානයේ පැවැත්වීම සිදු කළේය. MIDAS ආයතනය හා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය එක්ව සංවිධානය කරන ලද අතර මෙම වෛද්‍ය කඳවුරට සහභාගි වූ බොහෝ දෙනෙකුට රුධිර පරීක්ෂාව සමේ රෝග පරීක්ෂා කිරීම ඇතුළු බොහෝමයක් පරීක්ෂණ

සිදුකර ගැනීමට හැකියාව සැලසුනි. ගංවතුර අපදාවෙන් පසුවද ඵලදායිතාවය වර්ධනය කර සේවක සුහසාධනය නඟා සිටුවීම මූලික අරමුණ විය.

**වෘත්තීය සෞඛ්‍ය සුරක්ෂිතතාව පිළිබඳ වතු කම්කරුවන් හා පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩමුළුව**

හපුතලේ නගරය ප්‍රධාන කරගෙන මෙම වැඩමුළුව පවත්වන ලදී. CSR ව්‍යාපෘතියකි. මෙම ප්‍රදේශය තෝරාගැනීමට ප්‍රධානතම හේතුව වූයේ තේ වතු කලමණාකාරතුමාගේ ප්‍රධාන කරගත් මහජන සෞඛ්‍ය නිලධාරීන් සහ පාසලෙහි ගුරුහවතුන්ගේ විශේෂ ඉල්ලීමකට අනුවය. එමෙන්ම තේවතු කළමණාකරුවන් ඔවුන්ගේ සේවකයන් සඳහා ප්‍රථමාධාර භාවිතය පිළිබඳ පුහුණුවක්ද ඉල්ලා සිටියේය. එමෙන්ම, එම ප්‍රදේශයේ ජනතාව වෙත ප්‍රවේශ වීමට ගමන් අපහසුතා ඇති බැවින් එම ප්‍රදේශයේ පාසල් ළමුන් හා සාමාන්‍ය ජනතාව අතිශ්‍ය බාධක වලින් යුක්තව තම එදිනෙදා කටයුතු සිදුකරගෙන යනු ලැබීය. ඒ අනුව ඔවුන්ගේ දැනුම අල්ප වූ බැවින් පාසල් සිසුන් සඳහා ප්‍රථමාධාර භාවිතය පිළිබඳ පුහුණුවක් ද ලබාදෙමින් ප්‍රථමාධාර බෙහෙත් පෙට්ටි ලබාදුන් අතර ප්‍රථමාධාර පෙට්ටියක මූලික වශයෙන් තිබිය යුතු ඖෂධ පිළිබඳ අවශ්‍ය ප්‍රායෝගික දැනුම ද ලබාදෙනු ලැබීය. එමෙන්ම මොවුනට දන්ත වෛද්‍ය සේවාව ලබාගැනීමට ප්‍රවේශවීම අතිශ්‍ය ගැටලුවක් බවට පත් වී තිබුනි. එනම් ඔවුන්ට නගරය කරා ප්‍රවේශවීමට වැඩි කාලයක් වැය වීම හේතුවෙනි. ඒ අනුව ඔවුන්ගේ ඉල්ලීම අනුව ජංගම දන්ත වෛද්‍ය මධ්‍යස්ථානයක් සංවිධානය කල අතර ප්‍රථමාධාර පෙට්ටි 08ක් සහ ජලය එකතුකරගැනීමේ ටැංකි පරිත්‍යාග කිරීම සිදු විය. මෙම අවස්ථාව සාර්ථක ලෙස සංවිධානය කර පවත්වාගෙන යැමට උදව් කල සියලු දෙනාට අපගේ කෘතඥතාවය පුද කරන්නෙමු.




**වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සමීක්ෂණ සහ පර්යේෂණ**

කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ සිසුන් තිදෙනෙකු වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂාව සම්බන්ධයෙන් පර්යේෂණ සිසු කිරීමට පර්යේෂණ මාතෘකා තුනක් යටතේ තම පර්යේෂණ මාතෘකා ඉදිරිපත්කර ඇත. එම පර්යේෂණ මාතෘකා පහත පරිදිය.

1. ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සහ ඉදිකිරීම් කර්මාන්තයේ කම්කරුවන් අතර ඇතිවන වෘත්තීමය ආබාධ හා අනතුරු වාර්තා නොකිරීම සම්බන්ධයෙන් හේතු සොයා බැලීම.
2. පිළිකාරෝහලේ සිටින රෝගීන්ගේ රෝගීතත්ත්වයට ඔවුන්ගේ රැකියාව සමඟ ඇති සහසම්බන්ධතාවය හඳුනාගැනීම.
3. කොළඹ ලය රෝහල් සායනයට සහභාගීවන රෝගීන්ගේ රැකියාව සමඟ ඇති සහසම්බන්ධතාවය හඳුනාගැනීම.

මෙම පර්යේෂණයන්ට අදාළ විස්තර අපගේ වෙබ් අඩවියෙන් භාගත කරගැනීමට හැකියාව ඇත.

## <u>දැනුවත් කිරීමේ සහ පුහුණු වැඩසටහන්</u>

NIOSH දෛනික වැඩ කටයුතු

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ දෛනික වැඩකටයුතු සෞඛ්‍ය හා සුරක්ෂිතතාවය වැඩි දියුණු කිරීම හා සියලු වැඩ ස්ථානවල කම්කරුවන්ගේ ආරක්ෂාව සහතික කිරීමේ අරමුණින් එහි පවත්වයි. NIOSH හි කටයුතු පහත සඳහන් පරිදි සිදුකරන අතර මෙම කාර්යයන් ඉටු කිරීම සඳහා,

**පාරිසරික සමීක්ෂණ වැඩසටහනඃ-**
කර්මාන්තයේ වැඩ කරන පාරිසරික ප්‍රමිතින් සහතික කිරීමට එවායෙහි උෂ්ණත්වය, ආලෝකය, ශබ්දය, වායු, ගෘහස්ත වායු තත්ත්ව ලෙස වැඩකරන පාරිසරික උවදුරු මැනීම සඳහා වගකීම ගනිමින් සිදුකරනු ලබයි. NIOSH 2015 වසර තුළ දී 150කට වැඩි සේවා ස්ථාන පාරිසරික අධීක්ෂණ සේවා සැපයුම්කරුවෙකු ලෙස අධීක්ෂණ කටයුතු සිදුකර ඇති අතර 2016 වසර තුළ දී 300කට වැඩි සේවා ස්ථානයන්හි පාරිසරික අධීක්ෂණ සේවා කටයුතු සිදු කර ඇත.

**වෛද්‍ය පරීක්ෂණ**
NIOSH කර්මාන්තයේ අවශ්‍යතා අතරින් එකක් වන වැඩ කිරීමට යෝග්‍යතා ශ්‍රමිකයන් පිරිසක් සිටිය ද යන්න පරීක්ෂා කර වෛද්‍ය වාර්තා ලබාදීම ආරම්භ කර ඇත. ඒ අනුව NIOSH ශාරීරික යෝග්‍යතා පරීක්ෂණ එනම්, BMI ගණනය, ශ්‍රවණ පරීක්ෂණ සහ පෙනහළු වල ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීම, රුධිර පීඩනය පරීක්ෂාව හා එකතු අනුපාත, අක්ෂි පරීක්ෂණ, රුධිර පරීක්ෂණ ආදි පරීක්ෂණ මාලාවක් සිදු කිරීම අප ආයතනය විසින් සිදු කරනු ලබයි.

**අවධානම් ඇගයීම හා විගණන**
අප ආයතනය විසින් අවධානම ඇගයීම හා කාර්මික වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය විගණන පැවැත්වීම හා කර්මාන්තය තුල ආබාධවලට ලක්වීම හැකිතාක් අවම කිරීමට උපදෙස් දීම හා නිර්දේශ හඳුනාගැනීම හා සැපයීම මේවන විට සිදු කරනු ලබයි.

- අවධානම් ඇගයීම සහ වාර්තා ලිවීම (වාර්තා ලිවීම සඳහා නව තාක්ෂණය හඳුන්වා දෙනු ඇත ඒ අනුව i-pad & custom software with customized template භාවිත කරනු ලබයි.
- Blue Mountain ඉදිකිරීම් සඳහා ඉදිකිරීම් ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම




**වෘත්තීය සුරක්ෂිතතා සතිය තුළ විශ්වවිද්‍යාල සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම**

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් කළමනාකරණ පීඨය සමඟ සම්බන්ධ වී 2016 ඔක්තෝම්බර් 13වන දින වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ පුහුණු සැසියක් පවත්වන ලදී.

එමෙන්ම මොරටුව විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය සමඟ ද සම්බන්ධ වී පූර්ණ දින වැඩමුළුවක් පැවැත්වූ අතර එහි දී මොරටුව විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමා විසින් ශ්‍රී ලංකාව තුළ වෘත්තීය සෞඛ්‍ය ආරක්ෂාව පිළිබඳ සංස්කෘතියක් වැඩි දියුණු කිරීම පිළිබඳව පූර්ණ කැපවීමකින් කටයුතු කල අප ආයතනයේ කැපවීම අගයකරන ලදී.

මීට අමතරව කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රජා වෛද්‍ය පීඨය සමඟ එකට එකතු වී එම අධ්‍යයන අංශයේ විද්‍යාර්ථීන් සඳහා වෘත්තීය සෞඛ්‍ය සුරක්ෂිතතාව පිළිබඳව පුහුණු සැසි කිහිපයක් පවත්වන ලදී.

NIOSH විසින් තම සේවාව කොතලාවල ආරක්ෂක ඇකඩමියේ සෞඛ්‍ය විද්‍යා අංශයට ද තම සේවාවන් සැපයීම සිදුකරනු ලබයි.

**ඉදිරියට ක්‍රියාත්මකවන ක්‍රියාකාරකම්**

- තොරතුරු තාක්ෂණ පාදක කරගනිමින් ක්‍රියාත්මකවන කළමනාකරණ පද්ධතිය
- වෙබ් එක අලුත්වැඩියා කර ප්‍රදර්ශනය කිරීම

- NIOSH සුදුසුකම් සහිත ආරක්ෂිත බලපත්‍ර පද්ධතිය
- ISO 9001 සහතික පත්‍රය ලබාගැනීම
- NIOSH පැතිකඩ සදහන් වාර්තාව




NIOSH ආයතනය සඳහා ප්‍රවර්ධනය සඳහා විඩියෝ පටයක් සකස් කිරීම

2016 වර්ෂය තුළ ආයතනය විසින් කරන ලද සේවාවන් පිළිපබඳ දැනුවත් කිරීම සඳහා ප්‍රකාශන NIOSH  Sport light ලෙස නමින් ප්‍රවෘත්තිපත්‍රිකාවක් එලි දැක්වීම.



සුරක්ෂිතතා හා සෞඛ්‍ය කමිටුව නමින් කුඩා පොතක් ආයතන හා කර්මාන්ත වෙත නිකුත් කිරීම





**ආයතනික ස්ථාවරත්වය හා එහි වර්ධනය**

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය ප්‍රධාන කර්මාන්ත අතර වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳව සැපයුම්කරු වශයෙන් ප්‍රධාන වෙළඳ නාමයක් ලෙස සලකනු ලබන අතර අප රටෙහි ප්‍රධාන වෙළඳ නාමයක් ලෙස අප ආයතනයේ නාමය ප්‍රචාරණය කරනු ලබන්නෙමු.


**2011 වසරේ සිට 2016 වසර දක්වා NIOSH සේවා සැපයීම ප්‍රගතිය**





2011 වසරේ දී කර්මාන්ත 33ක් පමණ ආවරණය වන පරිදි සේවා සැපයීම බස්නාහිර පළාතට සීමා විය.

2012 වසරේ දී කර්මාන්ත 60ක් පමණක් ආවරණය වන පරිදි සේවා සැපයීම බස්නාහිර පළාත හා මධ්‍යම පළාතට සීමා විය.




2013 වසරේ දී කර්මාන්ත 90ක් පමණ ආවරණය වන පරිදි සේවා සැපයීම බස්නාහිර, මධ්‍යම, දකුණ,උතුරු මැද, වයඹ පළාතට ව්‍යාප්ත විය.

2015-2016 දී කර්මාන්ත 500ක් පමණ ආවරණය වන පරිදි දිවයිනේ දිස්ත්‍රික්කයන් විශාල ගණනක් ආවරණය වන පරිදි අපගේ සේවාවන් ව්‍යාප්ත කිරීමට හැකි විය.

**වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ අධ්‍යනය සඳහා වූ පුස්තකාලය**

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතන පරිශ්‍රයේ බිම් මහලේ වෘත්තීය සුරක්ෂිතතාවය සම්බන්ධව ප්‍රයෝජනවත් පොත්පත් රාශියක් පුස්තකාලය සතු වේ. පහත සඳහන් විෂයන් පිළිබඳ පොත්පත් වාර සඟරා, පත්‍රිකා, වාර්තා, නිබන්ධන, පූර්ණ මුද්‍රණ, මොඩියුල, රසායනික ආරක්ෂණ දත්ත සටහන් පත්‍ර, දත්ත පාඨක පුවත්පත් ලිපි ආදිය සම්බන්ධව අධ්‍යනය කරන සිසුන්ගේ පරිශීලනය සඳහා සතියේ දින වල විවෘතව ඇත.

- වෘත්තීය සෞඛ්‍යය
- කර්මාන්ත
- පාරිසරික
- මහජන
- වැඩකිරීමට සුදුසු පරිසරය
- කාර්මික ආරක්ෂාව
- රසායනික ආරක්ෂාව
- වෘත්තීය රෝග
- කර්මාන්ත නීති සම්පාදනය
- විෂ විද්‍යාව
- ජලය සහ සනීපාරක්ෂාව

ආයතනයේ මූල්‍ය ප්‍රගතිය

ස්වයං මූල්‍ය පහසුකම් සලසාගන්නා ආයතනයක් ලෙස කටයුතු කිරීමට ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය ස්ථාපිත කරන ලදී. එය 2011 වසරේ සිට සිය මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලද අතර ඉතා සුළු කාර්ය මණ්ඩලය සමග රට පුරා සිය සේවා පුළුල් කිරීමට හැකි විය. මෙහිදි විශ්ලේෂණය වනුයේ ඉතාම කෙටි කාලයකින් අදාල අරමුණු හා ඉලක්ක කරා ලගාවීමට හැකිවීමයි. 2016 වන විට ආයතනය විසින් ලබා ඇති ශුද්ධ ලාභය මිලියන 12.6 ක් වන අතර මෙයය උපයා ඇත්තේ මෙහෙයුම් ආදායම් වලින් වීම විශේෂ කරුණකි. පසුගිය වසර හා සැසදීමේ දී මිලියන 05ක ප්‍රමාණයක් ශුද්ධ ලාභය වැඩිවීමක් පෙන්නුම්කරයි. පහත වගුවට අනුව මෙහෙයුම්වලින් ලද ආදායමෙහි ද වෛද්‍ය පරීක්ෂණ හැරුණුකොට අනෙකුත් ආදායම් මාර්ගයන්හි ප්‍රවනතාවයක් දක්වනු ලබයි.

## <u>මූල්‍ය විශ්ලේෂණ 2015 - 2016</u>

| | 2015 | 2016 |
|---|---|---|
| වෘත්තීය සුරක්ෂිතතා පාඨමාලා වලින් ලද ආදායම | 8,407,400.00 | 13,420,433.00 |
| පාරිසරික මිනුම් වලින් ලද ආදායම | 8,919,300.00 | 9,380,900.00 |
| වෙනත් ආයතනය සමග ඇතිකරගත් සහයෝගීතා ගිවිසුම් තුලින් සපයනු ලැබූ සේවා සදහා ලබාගත් ආදායම | 2,077,484.00 | 3,363,933.75 |
| වෛද්‍ය පරික්ෂණ කටයුතු තුළින් ලද ආදායම | 3,017,700.00 | 1,753,550.00 |
| වෘත්තීය සෞඛ්‍ය සුරක්ෂිතතා සතිය තුළින් ලද ආදායම | | 15,352,750.00 |
| පොළී ආදායම | 2,992,408.91 | 4,979,759.00 |
| වෙනත් ආදායම් | 61,022.00 | 247,308.00 |
| එකතුව | <u>25,475,314.91</u> | <u>48,498,633.84</u> |

ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව වර්තමාන මූල්‍ය තත්ත්වය පිළිබඳව සැලකීමේදි ආයතනය සතු මුළු වත්කම් මිලියන 100 ක් වන අතර ආයතනය ඉන් සංවර්ධන අරමුදල තුළ විසින් රු. මිලියන 59 ආයෝජනය කොට තිබීම සුවිශේෂි ලක්ෂණයකි. තවද ආයතනයයේ වගකීම වශයෙන් මිලියන 1.8 ක් දක්වා ඇතත් එයද අභ්‍යන්තර ආයතනවලට ඇති බැදීම්වීම විශේෂයකි. සමස්ථයක් වශයෙන් තැන්පත්කල මූල්‍යමය තත්ත්වය ස්ථාවර මට්ටමක පවතී.

**මූල්‍ය තත්ත්වය ප්‍රකාශය**

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

2016 දෙසැම්බර් 31 වන දිනට

**ශේෂ පත්‍රය**

| | | 2016 | 2015 |
|---|---|---|---|
| **වත්කම්** | | රු. | රු. |
| ජංගම වත්කම් | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | **Note 1** | 4,458,171.75 | 753,803.60 |
| ලැබිම් | **Note 2** | 14,223,633.35 | 9,574,102.02 |
| සංවර්ධන අරමුදල | | 59,950,019.76 | 46,252,823.65 |
| | | 78,631,824.86 | 56,580,729.27 |
| **ස්ථාවර වත්කම්** | | | |
| භාණ්ඩාගාර තැම්පතු | | 267,500.00 | 267,500.00 |
| දේපල පිරියත හා උපකරණ | **Note 3** | 21,137,628.38 | 21,890,542.61 |
| | | 21,405,128.38 | 22,158,042.61 |
| **මුළු සංචිත** | | 100,036,953.24 | 78,738,771.88 |
| **වගකීම්** | | | |
| ජංගම වගකීම් | | | |
| ගෙවිම් | **Note 5** | 1,997,414.53 | 1,819,228.15 |
| මුළු වගකීම් | | 1,997,414.53 | 1,819,228.15 |
| **ශුද්ධ වත්කම්** | | 98,039,538.71 | 76,919,543.73 |
| අතිරික්ත ආදායම | **Note 4** | 92,206,989.71 | 59,862,816.71 |
| භාණ්ඩාගාර ලැබීම් | **Note 6** | 4,182,549.00 | 15,406726.97 |
| වෛද්‍ය උපකරණ පරිත්‍යාග - ජාතික වෛද්‍ය අරමුදල | | 1,650,000.00 | 1,650,000.00 |
| **මුළු ශුද්ධ වත්කම්** | | 98,039,538.71 | 76,919,543.68 |

**ආදායම් ප්‍රකාශය**

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ආදායම් ප්‍රකාශය

| ආදායම | 2016 | 2015 |
|---|---|---|
| භාණ්ඩාගාර ලැබීම් | 3,200,000.00 | - |
| මෙහෙයුම් ආදායම | 48,498,633.84 | 29,523,539.91 |
| | 51,698,633.84 | 29,523,539.91 |

(-)

**වියදම්**

| | | |
|---|---|---|
| ආයතන පරිපාලන වියදම් | 31,771,349.69 | 20,031,368.05 |
| මූල්‍ය වියදම් | 21,381.88 | 45,192.03 |
| ක්ෂය | 4,104,282.61 | 2,360,194.80 |
| **මුළු වියදම්** | 35,897,014.18 | 22,436,754.88 |
| | | |
| **වර්ෂයේ අතිරික්තය** | **15,801,619.66** | **7,086,785.03** |

## ගිණුම්වලට අදාළ සටහන් - ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

**1 . වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**1.1** වාර්තා කරන ආයතනය

ශ්‍රී ලංකාවේ කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍යාංශය යටතේ වන ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය 2005 අප්‍රේල් 28 වැනි දින ස්ථාපිත කරන ලදී. ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය, නිසි සෞඛ්‍ය හා ආරක්ෂිත පියවර පිළිබඳ දැනුවත්භාවය සහ බැඳියාව වැඩි කිරීම තුළින් සියලු දෙනා සඳහා යහපත් වැඩ පරිසර තත්ත්වයන් ඇති කිරීමට කැපවී සිටියි. මෙම ආයතනය කොළඹ - 05, ජාවත්ත පාරේ අංක 97 දරන ස්ථානයේ පිහිටා තිබේ.

**1.2** ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

යෝග්‍ය සෞඛ්‍ය සහ ආරක්ෂණ නීතිරීති පිළිබඳ දැනුවත්භාවය සහ බැඳියාව වැඩි කිරීම තුළින් සියලු දෙනා සඳහා යහපත් වැඩ පරිසර තත්ත්වයන් ඇති කිරීමට ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය කැපවී සිටියි. මෙම ක්‍රියාකාරකම්වලට යාවත්කාලීන කරනු ලැබූ තොරතුරු බෙදා හැරීම සහ උපදේශක හා උපදේශන සේවා ඇතුළත්වේ. මෙම ආයතනය මගින් සිදුකරනු ලබන පුහුණු කිරීම් තුළින් ප්‍රතිලාභ ලැබිය හැකි සේව්‍යයන්, සේවකයන් හා වෙනත් සියලුම ගණයන්හි ජනතාව දැනුවත් කිරීම සහ පුහුණු කිරීම මෙන්ම වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍යය පිළිබඳ ක්ෂේත්‍රයේ විමර්ශන අධ්‍යයන, සමීක්ෂණ සහ පර්යේෂණ සඳහා ආයතනය සහයෝගය දක්වයි.

**1.3** පිළියෙළ කිරීමේ පදනම

(අ) අනුකූලතා ප්‍රකාශය

මෙම ආයතනයේ මූල්‍ය ප්‍රකාශලවලට ශේෂ පත්‍රය, ආදායම් ප්‍රකාශය, ස්කන්ධ වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට සටහන් ඇතුළත් වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය (ICASL) විසින් පනවා ඇති කුඩා ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට ( SLASSE) අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට තිබේ.

(ආ) මිනුම් පදනම

ඓතිහාසික පිරිවැය පදනම මත මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට තිබේ. මූල්‍ය ප්‍රකාශනවල උද්ධමන සාධක සඳහා කිසිදු ගැලපීමක් සිදුකර නැත.

(ඇ) සක්‍රිය සහ ඉදිරිපත් කරන ව්‍යවහාර මුදල්

මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන්නේ ආයතනික ව්‍යවහාර මුදල් වන ශ්‍රී ලංකා රුපියල් වලිනි.

## 2. දේපළ, පිරියත හා උපකරණ

***i.*** හඳුනාගැනීම හා මැනීම

භාණ්ඩ විෂයයන් දේපළ, පිරියත හා උපකරණ මනිනු ලබන්නේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂයවීම් අඩු කිරීම සහ සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිවීම්වලින් සිදුවන අලාභ පදනම් කරගෙනය.

යන්ත්‍ර සූත්‍රයකට සහ උපකරණයකට අයත් භාණ්ඩ විෂයයක පිරිවැයට ඇතුළත් වන්නේ එය මිලදී ගත් වටිනාකම සහ එය අපේක්ෂිත ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා එකී වත්කම ක්‍රියාකරවීමට ඍජුව දරන ලද පිරිවැයයි.

කිසියම් දේපළකට, යන්ත්‍ර සූත්‍රයකට හෝ උපකරණයකට අයත් භාණ්ඩ විෂයයක උපාංගයක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරන ලද වියදම් වෙන වෙනම ගිණුම්ගතකොට තිබේ නම්, උපාංගය පිළිබඳව ඉදිරියට ගෙන යන කපාහළ වියදම්වලට ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. ඉන්ඉක්බිතිව කරනු ලබන වියදම් ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ දේපළ, පිරියත හා උපකරණවලට අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ එමගින් වැඩිවන්නේ නම් පමණි. සෙසු වියදම් දරනු ලැබූ පරිද්දෙන් වේ.

***ii.*** ක්ෂයවීම්

වත්කමේ ප්‍රයෝජනවත් ජීව කාලයට අනුව ඍජු රේඛා පදනමක් මත ආදායම් ප්‍රකාශය තුළ ක්ෂයවීම් හඳුනා ගැනේ.

ප්‍රවර්තන හා සංසන්දනාත්මක කාල සීමා සඳහා ඇස්තමේන්තු කරන ලද ප්‍රයෝජ්‍ය ආයුකාලයන් පහත දැක්වේ.

| | අවුරුදු |
|---|---|
| යන්ත්‍ර කට්ටල හා යන්ත්‍ර සූත්‍ර | 10 |
| පරිගණක උපකරණ | 5 |
| ලීබඩු සහ සවිකිරීම් | 10 |
| ශබ්ද පද්ධති අයිතම | 5 |
| වෛද්‍ය උපකරණ | 10 |
| වෙනත් වත්කම් | 10 |

මිලදී ගත් අවුරුද්ද තුළ ක්ෂයවීමක් සිදු නොකෙරෙන අතර අපහරණය කරන වර්ෂයේදී ඊට සම්පූර්ණ ක්ෂයවීමක් ඇතුළත් වේ.

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT

## විගණන විමසුම - AUDIT QUERY - கணக்காய்வு விசாரணை

විමසීම් අංකය / விசாரணை இலக்கம் / Query No: එල්ඊඩබ්/ඒ/එන්අයිඕඑස්එච්/ඒ,ඞී /2017/01

නිකුත් කරන දිනය / வழங்கிய திகதி / Date of issue: 2018 මාර්තු 16 දින.

Adressed to අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතනය. වෙතටයි அவர்களுக்கு

විෂයය / விடயம் / Subject: මූල්‍ය විගණනය - 2017

**මෙය පැහැදිලි කිරීම සඳහා තොරතුරු කැඳවීමක්/විමසීමක් වන අතර විගණන වාර්තාවක් නොවේ.**
This is only a query calling for information for clarification and not an audit report.
**இவ்விசாரணை தகவல்களைப் பெற்றுக் கொள்ளவும், பகுப்பாய்வதற்காகவுமே அன்றி இது ஒரு கணக்காய்வு அறிக்கை அல்ல.**

noted. Nelson p... r

වර්ෂයේ ප්‍රසම්පාදන කටයුතු

**01.** ප්‍රසම්පාදන සැලැස්ම

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 සඳහන් පරිදි ආකෘතිය ප්‍රකාරව ආයතනයේ 2017 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි. ඒ අනුව විධිමත් ප්‍රසම්පාදන සැලැස්මකින් තොරව රජයේ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම හේතුවෙන් ප්‍රධාන ප්‍රසම්පාදන මූලධර්මයන් ළඟාකර ගැනීමට නොහැකි තත්වයක් පවතින බව නිරීක්ෂණය විය.

**02.** ප්‍රවාහන පහසුකම් සපයාගැනීම

ප්‍රවාහන පහසුකම් සපයාගැනීම වෙනුවෙන් වෑන්රථ හා කාර් රථ සේවාවන් සපයන ආයතන 09 කින් මිල ගණන් කැඳවා ඇති අතර ඒ අතරින් වෑන් රථ සඳහා අවම මිල ගණන් කැඳවා ඉදිරිපත් කර තිබූ Mark A Tours (Pvt) Ltd ආයතනයෙන් සහ කාර් රථ සේවාව සඳහා Budget Meter Taxi (Pvt) Ltd ආයතනයෙන්ද සේවාව ලබාගැනීමට ප්‍රසම්පාදන කමිටු තීරණ අංක Niosh /Proc /2017 – 16 මඟින් අනුමැතිය ලබා දී තිබුණි.

එහි දී සිදුකළ විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ කරුණු පහත පරිදි වේ.

ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය 21 MAR 2018 NIOSH

අංක 306/72 පොල්දූව පාර බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. / இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. / No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
දුරකථනය / தொலைபேசி / Telephone: 2887028-34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No: 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail: oaggov@sltnet.lk

(අ) මිල ඇස්තමේන්තු ඉදිරි පත් කරන ලෙස ආයතන වලට ආරධනා කරන ලේඛනයේ පිරිවිතරවල සඳහන්ව තිබුණේ වෑන්රථ කාර්රථ සඳහා මිල ගණන් ඉදිරිපත් කරන ලෙසය. එම නිසා දැන්වීමේ පරිදි ආයතන විසින් වෑන්රථ හා සුඛෝපබෝගී කාර්රථ (Luxury Cars) සඳහා මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. නමුත් Budget Meter Taxi (Pvt) Ltd ආයතනය පමණක් ඊට අමතරව නැනෝකැබ් රථ සේවාව සඳහා මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. ආයතනයේ කාර්යභාරයන් සඳහා නැනෝ කැබ්රථ සේවාව ප්‍රමාණවත් වීමත්, කාර් රථ සඳහා වැඩි වියදමක් දරා කුලියට ගැනීමෙ අනවශ්‍ය බව සලකා Budget Meter Taxi ආයතනයෙන් අදාල සේවාව ලබාගැනීමට ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි.

2016 වර්ෂයේදී ප්‍රවාහන පහසුකම් සපයාගැනීමේදී ද ප්‍රසම්පාදන කමිටුව මේ හා සමාන අනුමැතියක් ලබා දී තිබූ අතර එහි දී ද අනුමත කරගෙන තිබුණේ නැනෝ කැබ් රථ සේවාවක් ලබාගැනීමටය.

ඒ අනුව ආයතනයේ අවශ්‍යතාවය කලින් වර්ෂයේදී හඳුනාගෙන තිබීමත් ඒ පිළිබඳව පැහැදිලිව මිල කැඳවීමේ ලේඛනවල සඳහන් නොවීමෙන් සුදුසුකම්ලත් උනන්දුවක් දක්වන ලංසුකරුවුන්ට ප්‍රසම්පාදනයට සහභාගීවීමට සාධාරණ, සමාන හා උපරිම අවස්ථාවක් ලබා දී නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) ලංසු කැඳවීමේ ලේඛනවල ලංසු විවෘත කිරීමේ දිනය, වේලාව සහ ස්ථානය සම්බන්ධයෙන් තොරතුරක් සඳහන් වී නොතිබුණු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.3 ප්‍රකාරව ලංසු විවෘත කිරීමේ කාර්යය පටිපාටියේ විනිවිදභාවයක් නොතිබුණි.

**03. ආයතනයේ ඉදිරිපස හා අවට පරිසරය අලංකාර කරවා ගැනීම**

රු. 546,448.05 වියදමක් දරා ආයතනයේ ඉදිරිපස අලංකාර කර ගැනිම Seegiri Land ආයතනය මඟින් සිදුකරවා ගෙන තිබුණි. එහි දී නිරීක්ෂණය වූ කරුණු පහත පරිදි වේ.

මිල ඇස්තමේන්තු ඉදිරිපත් කරන ලෙස ආයතනය වෙත දන්වා යැවූ ලිපියේ දෙවන අයිතමය සඳහා ප්‍රමාණය ලෙස සඳහන් කර තිබුණේ 600 Sq.ft කි. කෙසේ වෙතත් තෝරාගත් සැපයුම්කරු එවන ලද මිල ඇස්තමේන්තුවේ ඒ සඳහා සඳහන් කර ඇති ප්‍රමාණය 660Sq.ft වන අතර එය ඉංජිනේරු ඇස්තමේන්තුවේ සඳහන් ප්‍රමාණය සමඟ සැසඳේ. ප්‍රතික්ෂේප වූ අනික් සැපයුම්කරු ලංසු කැඳවීමේ ලේඛනයේ සඳහන් පරිදි 600Sq.ft ක ප්‍රමාණයට මිල ගණන් ඉදිරිපත්කර තිබුණි. තෝරාටගත් ලංසුකරු සහ ඉංජිනේරු ඇස්තමේන්තුව අතර විචලනය 1.5 % ක් වූ අතර අනෙක්

ලංසුකරුගේ මිල ගණන් විචලනය 95% ක් වූ බැවින්ද තෝරාගත් සැපයුම්කරු ඉංජිනේරු ඇස්තමේන්තුවේ සඳහන් පරිදිම එම වර්ග අඩි ප්‍රමාණය එනම් 660 Sq.ft සඳහා මිල ගණන් ඉදිරිපත් කර තිබීමත් නිසා ප්‍රසම්පාදනයේ විනිදභාවය විගණනයේදී ගැටළු සහගත විය.

04. නාමපුවරු සකසා සවිකර ගැනීම

නාමපුවරු සකසා සවිකර ගැනීම සඳහා ආයතන දෙකකින් මිල ගණන් ලැබී තිබූ අතර ප්‍රසම්පාදන කමිටු තීරණ අංක NIOSH/PROC/17/06 අනුව අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ Nelu's Advertising (Pvt) Ltd ආයතනය වෙතින් සිදුකරවා ගැනීමට අනුමැතිය ලැබී තිබුණි. මෙහි දී ඉදිරිපත් කර තිබූ ලංසු විවෘත කිරීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 6.3.3 (අ) ප්‍රකාරව ලංසු විවෘත කිරීමේ කමිටුවක් ප්‍රම්පාදන කමිටුව විසින් අනුමත කර පත්කර නොතිබුණි.

05. ප්‍රසම්පාදනය සැලසුම් කර නොතිබීම

(අ) පවිත්‍රතා සේවා සපයාගැනීම සම්බන්ධ ගිවිසුම මාස 03 ක කාලයක් දීර්ඝ කර ගැනීම

පවිත්‍රතා සේවා සපයන Topshine Environmental Services (Pvt) Ltd ආයතනයේ සේවා ගිවිසුම 2017 පෙබරවාරි 28 දිනෙන් අවසන්ව ඇති අතර නව පවිත්‍රතා සේවාවක් ලබා ගැනීම සඳහා ආයතනයක් තෝරාගැනීමේ ප්‍රසම්පාදන කටයුතු නියමිත කාලයට සැලසුම් කර ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් පෙර සේවාව සපයන ලද ආයතනය සමඟ ඇති කරගත් ගිවිසුම මාස 03 ක කාලයකට දීර්ඝ කරගෙන තිබුණි. ඒ අනුව ඉහළ කළමනාකාරිත්වය විසින් ගිවිසුම් කාලය අවසන් වීමට පෙර ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුව සුදුසු ආයතනයක් තෝරා ගැනීමට සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළයුතු වුවත් එසේ ක්‍රියාකර නොතිබුණි.

(ආ) පවිත්‍රතා සේවාව සපයාගැනීම සම්බන්ධ ආයතනයක් තෝරා ගැනීම

ප්‍රසම්පාදන කමිටු තීරණ අංක NIOSH/Proc/17-11 ප්‍රකාරව පවිත්‍රතා සේවාව ලබාගැනීම සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ Topshine Environ mental Services (Pvt) Ltd ආයතනය තෝරාගෙන තිබුණි.

පවිත්‍රතා කටයුතු වැනි සේවාවක් බාහිර ආයතනයකින් ලබා ගැනීමේදී එම සේවාව සපයන ආයතනය සමඟ ගිවිසුමකට එළඹිය යුතු වුවත් සේවා ගිවිසුමකට එළඹ

නොතිබුණි. තවද සේවාව සපයන ආයතනය විසින් සේවා ගිවිසුම උල්ලංඝනය කළහොත් ප්‍රසම්පාදන අස්ථිත්වයේ ආරක්ෂාව සඳහා කාර්යය සාධන සුරක්ෂණයක් තබාගැනීම උචිත බව නිරීක්ෂණය කරනු ලැබේ.

06. බිම්මහල් නවීකරණ කටයුතු සිදුකිරීම

ප්‍රසම්පාදන කමිටු තීරණ අංක NIOSH/Proc/17/04 අනුව බිම් මහලේ නවීකරණ කටයුතු රු.484,105.17 ක මුදලකට Pahan Construction ආයතනයෙන් සිදුකරවාගෙන තිබුණි. මෙහිදී ආයතනයේ අවශ්‍යතාවය, මිල කැඳවන අවස්ථාවේදී හඳුනාගෙන නොතිබුණු අතර අලුත්වැඩියා කටයුතු සිදුකරගෙන යන අතරතුර හඳුනාගත් නවීකරණ කටයුතු සඳහා නැවත එම ආයතනයෙන්ම මිල ගණන් කැඳවා එම කාර්යය සිදුකරගෙන තිබුණි. අවශ්‍යතාව කලින් හඳුනාගෙන මිල කැඳවීම් ලේඛනවල සඳහන් නොකර තිබීම නිසා සාධාරණ හා අවම ප්‍රශස්ත මිලකට එම කාර්යය සිදුකරවා ගැනීමට තිබූ අවස්ථාව මගහැරී තිබුණි.

07. **Portable Hemoglobin Analyzers 3 ක් මිලදී ගැනීම**

ප්‍රසම්පාදන කමිටු තීරණ අංක NIOSH/Proc/2017/22 ප්‍රකාරව ආයතනය සඳහා Portable Hemoglobin Analyzers 03 ක් Elixir Health Care (Pvt) Ltd ආයතනය මඟින් රු.150,000 ට සහ එකක් රු.65 බැගින් ස්ට්‍රිප් (Strip) 600 ක් මිල දී ගෙන තිබුණි.
එහි දී සිදුකළ විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මිල කැඳවුම් ලේඛනවල සඳහන් පරිදි ලංසු ඉදිරිපත් කලයුතු අවසාන දිනට පසු දිනයකදී තෝරාගත් ආයතනය විසින් මිල ගණන් එවා තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.2 ප්‍රකාරව ප්‍රමාද වී ලැබෙන ලංසු විවෘත නොකරම ආපසු යැවිය යුතු වේ. ඒ අනුව සාධාරණ ප්‍රසම්පාදන පටිපාටියකදී ප්‍රතික්ෂේප වියයුතු ආයතනයකින් භාණ්ඩ මිල දී ගෙන තිබුණි.

(ආ) ආයතනය ඉදිරිපත් කර තිබූ පිරිවිතර වලට අනුව, තෝරාගත් සැපයුම්කරු තම මිල ගණන් එවා නොතිබුණ නිසා එය සාරානුකූල ප්‍රතිචාර දක්වන ලද ලංසුවක් නොවන බැවින් මූලික ඇගයීම් සිදුකිරීමේදීම ප්‍රතික්ෂේප වියයුතු ලංසුවක් විය.

(ඇ) මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.3 (අ) ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටුව විසින් ලංසු විවෘත කිරීමේ කමිටුවක් පත්කර නොතිබුණි.

08. මල්ටිමීඩියා ප්‍රොජෙක්ටර් සහ මල්ටිමීඩියා ප්‍රොජෙක්ටර් රඳවනයක් මිල දී ගැනීම

ප්‍රසම්පාදන කමිටු රැස්වීම් අංක NIOSH/Proc/17/20 අනුව ආයතනය සඳහා මල්ටිමීඩියා ප්‍රොජෙක්ටර් 02 ක් Debug Computer Peripherals (Pvt) Ltd ආයතනයෙන් රු.263,000 ක මුදලකට මිල දී ගෙන තිබුණි.

එම ආයතනය විසින් මල්ටිමීඩියා ප්‍රොජෙක්ටර් රඳවනයක් සපයනු නොලබන හෙයින් නැවත සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව මඟින් එය සිදුකරවා ගැනීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කර තිබුණි. ඒ සඳහා රු. 138,046 ක වියදමක් අනුමත කර තිබුණි. මෙවැනි තත්වයක් උද්ගත වන්නේ ආයතනය විසින් මිල කැඳවුම් ලේඛනවල මල්ටිමීඩියා ප්‍රොජෙක්ටර් සඳහා පමණක් මිල කැඳවා තිබූ නිසා සහ එය සවිකර ගැනීමේ වියදම එහි සඳහන් කර නොතිබුණු නිසාය. Debug Computer Peripherals (Pvt) Ltd ආයතනයෙන් මල්ටිමීඩියා ප්‍රොජෙක්ටර් සැපයුවද එය සවිකිරීම ප්‍රතික්ෂේප කර තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ලංසු කැඳවීමේ ලේඛනවල සියලු අවශ්‍යතාවයන් සඳහන් කර නොතිබීමත් ලංසු කැඳවීමේ ලේඛන සැලසුම් කර ඉදිරිපත් නොකිරීම හේතුවෙන් අවම මිලකට භාණ්ඩ සපයාගැනීමට තිබූ අවස්ථා මඟහැරී තිබුණි.

තවද විගණන දිනය වන විටත් මල්ටිමීඩියා ප්‍රොජෙක්ටර් 02 ක ආයතන වෙත ලැබී තිබුණද එය රඳවාගැනීමේ ප්‍රසම්පාදන කටයුතු ඊට පසුව සිදුකර ඇති බැවින් භාවිතයට නොගෙන තිබූ බව නිරීක්ෂණය විය.

09. විද්‍යා උපකරණ මිලදී ගැනීම

ප්‍රසම්පාදන කමිටු තීරණ අංක MPC/2017/22 – i ට අනුව ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය සඳහා විද්‍යා උපකරණ රු.5,370,000 ක මුදලකට Qulitron (Pvt) Ltd ආයතනයෙන් සහ රු.1,640,000 ක මුදලකට Razzmatazz Global Trading (Pvt) Ltd ආයතනයෙන්ද මිල දී ගැනීමට තීරණය කර තිබුණි.

එහි දී සිදුකළ විගණන පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(අ) ලංසු කැඳවීමේ ලේඛන

i. ආයතනය විසින් ලංසු කැඳවීමේ ලේඛන කෙටුම්පත් කිරීමේදී විද්‍යා උපකරණ වලට අමතරව රසායනාගාර පරිගණක සහ Desktop Computers සඳහා ද මිල ගණන් විමසා තිබුණි. විද්‍යා උපකරණ මිලදී ගන්නා ආයතන වලින්ම රසායනාගාර පරිගණක සහ Desktop Computers සඳහා ද මිල ගණන් විමසීම ඵලදායී ද යන්න විගණනයේදී ගැටලු සහගත විය. ආයතන 07 කින් මිල ගණන් කැඳවා තිබුණු අතර එක් ආයතනයකින් පමණක් පරිගනක සඳහා මිල ගණන් ඉදිරිපත් වී තිබුණි. එම යන්ත්‍ර සඳහා සාමාන්‍ය වෙළඳපොළ මිලට වඩා ඉහළ මිලක් ඉදිරිපත් වී තිබීම නිසා ඒ සඳහා නැවත මිල ගණන් කැඳවීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කර තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ යොමුව 5.2.1 ප්‍රකාරව ලංසු කැඳවීමේ ලේඛන කෙටුම්පත් කළ යුත්තේ ලංසුකරුවන් විසින් ප්‍රතිචාරාත්මක ලංසු ඉදිරිපත් කිරීමට අවස්ථා සැලසෙන පරිදිය. සාර්ථක ප්‍රසම්පාදනයකදී භාණ්ඩ අයිතමයන් මිලදී ගැනීමට ඒ සඳහා සුදුසු ආයතන වෙතින් මිල ගණන් කැඳවා තිබිය යුතු අතර ආයතනය විසින් එසේ කටයුතු කර නොතිබුණි.

(ආ) ලංසු විවෘත කිරීම

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ යොමුව 6.3.6 ප්‍රකාරව ලංසු විවෘත කිරීමේ කටයුතු නියමිත ආකෘතියේ වාර්තා කර නොතිබුණි. ලංසු විවෘත කිරීමේ වේලාව, ස්ථානය, ලංසු සුරක්ෂණ සහතික ඇති නැති බව සහ ඉදිරිපත් කරනු ලැබ ඇති ලංසුවල සඳහන් වෙනත් විශේෂ ලක්ෂණ කිසිවක් වෙතොත් ඒවා ලංසු විවෘත කිරීමේ වාර්තා සටහන්වල ඇතුළත් කළයුතු අතර ආයතනය විසින් එසේ කටයුතු කර නොතිබුණි.

(ඇ) ලංසු ඇගයීම

ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි අනෙකුත් පියවරයන් කොතරම් හොඳින් මෙහෙයවා තිබුණ ද ලංසු නිවැරදිව සහ සාධරණව ඇගයීම්කර නොතිබුණි නම් ප්‍රසම්පාදන ක්‍රියාවලිය බිඳවැටෙනු ඇත. තාක්ෂණික ඇගයීම් කමිටුවේ වාර්තාවේ සහ ලංසුකරුවන් විසින් එවන ලද ලංසු ලේඛනවල සඳහන් කරුණු සමඟ සසඳා බලන විට තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවේ වෙනස්කම් පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය. ඒවා පහත පරිදි වේ.

i. තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.8 ප්‍රකාරව සිදුකර තිබූ ප්‍රාරම්භක ලංසු පරික්ෂාවේදී සුදුසුකම් නිර්ණායකයක් (Qualification Criteria) ලෙස ව්‍යාපාර ලියාපදිංචි සහතිකය අවශ්‍යතාවයක් ලෙස සලකා බලා තිබුණි. කෙසේ වෙතත් Laboratory Equipment Company (Pvt) Ltd ආයතනය විසින් එවා තිබූ ලංසු ලේඛනවල එම ආයතනයේ ව්‍යාපාර ලියාපදිංචි සහතිකය අමුණා නොතිබුණි.
නමුත් තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවේ ව්‍යාපාර ලියාපදිංචි සහතිකය තිබූ බව සඳහන් කර තිබීම ගැටලු සහගත විය.

ii. Sound Level Meter මිල දී ගැනීමේ දී ආයතනයේ සඳහන් කර තිබූ පිරිවිතර වලට අනුකූල නොවූ අවස්ථා තිබූ අතර ඒවා තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවේ සඳහන් නොකර පිරිවිතර වලට අනුකූල බව සඳහන් කර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| අවශ්‍යතාවය | | ආයතනය විසින් එවන ලද ලංසු ලේඛනවල දැක්වෙන ආකාරය | | |
|---|---|---|---|---|
| | | Razzmatazz Global Trading | Rotax Ltd | Laboratory Equipment |
| i. | Weight with Batteries less than 500 g | - | 550 g | 650 g |
| ii. | Sound Measurement Range – 25 to 141 dB in steps of 10 dB | - | - | 21.4 to 140 dB |
| iii. | Frequency Range – 20 to 20,000 Hz | - | - | 8 Hz to 16 kHz |
| iv. | Sound Measurement Range – 25 to 141 dB in steps of 10 dB | 20 to 137 dB | - | - |

ඉහත නිරීක්ෂණ සැලකිල්ලට ගත්විට තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවේ නිවැරදිභාවය පිළිබඳ විගණනයේදී ගැටලු සහගත විය.

iii. විද්‍යා උපකරණ සැපයීම සම්බන්ධයෙන් අවම වශයෙන් අවුරුදු 03 ක පසුගිය අත්දැකීම් සනාථ කර ගැනීමට සහතික කළ ලේඛන ලංසුකරුවන් විසින් එවිය යුතු

බව ලංසු ලේඛනවල සඳහන්ව තිබුණි. රු.1,640,000 ට Digital sound Level Meters දෙකක් මිල දී ගෙන තිබූ Razzmatazz Global Trading ආයතනය ලංසු ලේඛනවල සඳහන් පරිදි අවම වශයෙන් අවුරුදු 03 ක අත්දැකීම් සනාථ කරන ලිපි ලේඛන ප්‍රමාණවත් පරිදි එවා නොතිබුණි. ආයතන දෙකකට පමණක් උපකරණ සැපයීම සම්බන්ධයෙන් ලිපි ලේඛන එවා තිබූ නමුත් ඉන් එක් ආයතනයක් 2016.11.24 දින උපකරණ සපයා තිබූ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය වෙත සපයා තිබූ උපකරණ සම්බන්ධයෙන් තහවුරු කර ගැනීමට ලිපිලේඛන නොවීය. කෙසේ වෙතත් තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවේ ද Razzmatazz Global Trading ආයතනය පසුගිය අත්දැකීම් සනාථ කරන ලිපි එවා නොතිබෙන සඳහන් කර තිබූ නමුත් ප්‍රසම්පාදන කමිටු තීරණයට අනුව එම උපකරණ මෙම ආයතනයෙන් මිලදී ගැනීම සිදුකර තිබුණි.

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය යොමුව 7.10 ප්‍රකාරව ඇගයුම් කළ අවම මිල සහිත ප්‍රතිචාරාත්මක ලංසුව ඉදිරිපත් කළ ලංසුකරුට තම කාර්යය ඉටු කිරීමට හැකියාව සහ ධාරිතාවය තිබෙන බව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් නිර්ණය කිරීමට පශ්චාත් සුදුසුකම් ඉවහල් වේ. ලංසුකරු විසින් තම කාර්යය ඉටුකිරීමට අවශ්‍ය පළපුරුදුකම් සහ හැකියාව පෙන්නුම් කිරීමට අපොහොසත්වේ නම් ලංසුව ප්‍රතික්ෂේප කර ඊළඟට සිටින ඇගයුම් කළ අවම මිල සහිත ලංසුකරු පශ්චාත් සුදුසුකම් පරික්ෂාවට යටත් කරණු ලැබිය යුතු නමුත් ආයතනය විසින් එසේ කටයුතු කර නොතිබුණි.

iv. Oriental optical Service (Pvt) Ltd ආයතනය විසින් ඉදිරිපත් කර තිබූ ලංසු සුරක්ෂණය වලංගු කාලපරිච්ඡේදයක් සඳහා සැපයීමට අපොහොසත් වී තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ඉදිරිපත් කර ඇති ලංසුවේ කාලසීමාව නියම කර ඇති කාල සීමාවට වඩා අඩු නම් එය ප්‍රතික්ෂේප කළ යුතුය. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය යොමුව 7.8 ප්‍රකාරව සියලුම ලංසු ප්‍රාරම්භක ලංසු ඇගයීමකට භාජනය කළ යුතුය. එහි අරමුණ වනුයේ කිසියම් ලංසුවක් ලංසු ලේඛනවල ගෙනහැර දක්වා ඇති අවම පිළිගත හැකි ප්‍රමිතීන්ට අනුකූල නොවන්නේ නම් තවදුරටත් වඩාත් සංකීර්ණාත්මක සලකා බැලීමකට භාජනය නොකොට ලංසුව බැහැර කිරීමයි. ලංසු ඇගයීම ප්‍රධාන පියවර 03 තකින් සමන්විත වන අතර එහි මූලික ඇගයීම ප්‍රාරම්භක ලංසු පරික්ෂාවයි. එම නිසා Oriental optical ආයතනය විසින් ඉදිරිපත් කර තිබූ ලංසුව ප්‍රාරම්භක ලංසු ඇගයීමේදීම ප්‍රතික්ෂේප විය යුතු අතර

විස්තරාත්මක ඇගයීමට භාජනය නොකළ යුතු නමුත් ආයතනය විසින් එසේ කටයුතු කර නොතිබුණි.

09. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.6 ප්‍රකාරව වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදනය සංකීර්ණ සහ සුවිශේෂ ක්‍රියාවලියක් වන අතර ඒ සඳහා විශේෂ අවධානය අවශ්‍ය වේ. ඒ සඳහා ඖෂධ ප්‍රසම්පාදනය සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහය අදාල කර ගතයුතු වේ. එහි 2.1 ඡේදය ප්‍රකාරව වෛද්‍ය උපකරණ මිල දී ගැනීමේ දී එම ආයතනය ඖෂධ හා සුවද විලවුන් නියාමන අධිකාරිය (Cosmetics, Devices and Drugs Regulatory Authority) හි ලියාපදිංචි විය යුතුය. එම නිසා ප්‍රසම්පාදන අස්ථිත්වය ලංසු කැඳවීමේ ලේඛනවල ඒ පිළිබඳව සඳහන් කර තිබිය යුතු අතර එය ඇගයීම නිර්ණායකයක් ලෙස සලකා බැලිය යුතුය. නමුත් ආයතනය විසින් එසේ කටයුතු කර නොතිබුණි.

10. ඖෂධ හා වෛද්‍ය උපකරණ සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 ඡේදය ප්‍රකාරව හදිසි සහ අත්‍යවශ්‍ය මිල දී ගැනීම් හැරුණු විට අනෙක් සෑම මිල දී ගැනීමක් සඳහාම තාක්ෂණික ඇගයීම් කමිටු අනුමැතිය අවශ්‍ය වන අතර එම කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

i. සෞඛ්‍ය අමාත්‍යංශයේ නියෝජිතයෙකු
ii. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ නියෝජිතයෙකු
iii. භාණ්ඩාගාරයේ හෝ ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතනයේ නියෝජිතයකු.

ඉහත මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටුව විසින් තාක්ෂණික ඇගයීම් කමිටුව පත්කිරීමට කටයුතු කර නොතිබුණි.

11. පොදු අඩුපාඩු

(අ) ආයතන විසින් සිදුකර තිබූ ප්‍රසම්පාදන කටයුතු සියල්ලෙහිම ලංසු විවෘත කිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය යොමුව 6.3.6 ආකෘතියේ "මූල්‍යමය තොරතුරු" යන ආකෘතිය පමණක් වාර්තා කර තිබූ අතර එක් එක් ලංසු පිළිබඳ නිරීක්ෂණ වාර්තා කර නොතිබුණි.

(ආ) සියලුම ලංසු කැඳවීමේ ලේඛන වල ලංසු විවෘත කිරීමේ දිනය, වේලාව සහ ස්ථානය සම්බන්ධයෙන් තොරතුරු සඳහන් වී නොතිබුණු අතර එම නිසා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.3(අ) ප්‍රකාරව ලංසු විවෘත කිරීමේ කාර්යයට ලංසුකරුවන්

සහභාගි වීමේ අවස්ථාව මගහැරී තිබුණි. එනම් ඇගයීමේ සහ තේරීමේ කාර්යය පටිපාටියේ විනිවිදභාවයක් නොතිබුණි.

12. වාහන පරීක්ෂාව

i. **wp KO - 7487** දරණ වාහනයේ සිදු වී ඇති අනතුර සම්බන්ධව

ආයතනයේ ප්‍රවාහන කාර්යයන් වෙනුවෙන් භාවිතා කරන wp KO-7487 දරන වාහනයේ ආයතන පරිශ්‍රය තුලදී සිදු වූ හදිසි අනතුර හේතුවෙන් රථය අළුත්වැඩියා කිරීම සඳහා රු.11,000 වියදමක් දරා තිබුණි. එම වියදම රක්ෂණ ආයතනයෙන් පියවාගත් බව දැනුම් දුන්නද එම වියදම සනාථ කර ගැනීමට කිසිදු ලියවිල්ලක් විගණනය සඳහා ඉදිරිපත් නොවුණි.

සිදුවී ඇති අනතුර සම්බන්ධ අලුත්වැඩියා කටයුතු සිදුකළ ආයතනය එම වියදම රක්ෂණ ආයතනය වෙත කෙලින්ම දැනුම් දුන් බව පැවසුවද ආයතනයක් වශයෙන් තමන් වෙත පවරා දී ඇති වත්කම්වල නඩත්තුව හා අලුත්වැඩියා කටයුතු සම්බන්ධයෙන් වගකීමක් ඇති බැවින් සිදුකළ අලුත්වැඩියාවේ බිල්පත ආයතනය වෙත ගෙන්වා ගතයුතු බව අවධාරණය කෙරේ.

ii. මු.රෙ 1645(ආ) සහ 1646 ප්‍රකාරව වාහනභාර නිලධාරීන් විසින් 268(අ) වැනි පොදු ආකෘති පත්‍රයේ ලියන ලද ගමන් පිළිබඳ මාසික සාරාංශයේ මුල් පිටපත ද සමඟ ඒ ඒ මාසයේ දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් විගණකාධිපති වෙත එවිය යුතු වේ. කෙසේ වෙතත් 2017 වර්ෂයේ ධාවන සටහන් විගණකාධිපති වෙත වාර්තා කිරීමට කටයුතු සිදුකර ඇති නමුත් 268(ආ) වැනි පොදු ආකෘති පත්‍රය ප්‍රකාර මාසික සාරාංශ මුල් පිටපත් සටහන් ඉදිරිපත් කර නොතිබුණි.

12. දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ආයතනය විසින් ගෙවිය යුතුව ඇති Payee tax මාස 04 ක රු.22,014 මුදලක් ඉගවා නොතිබුණු අතර ගෙවීම් ප්‍රමාද වීම හේතුවෙන් ප්‍රමාද ගාස්තු ගෙවීමට සිදුවන බව නිරීක්ෂණය විය. මෙම මුදල මුදල් පොතේ ගෙවා ඇති බව සටහන් කර ඇති නමුත් ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් වී නොතිබුණි.

| මාසය | ගෙවිය යුතු මුදල (රු.) |
|---|---|
| අප්‍රේල් | 1,341 |
| මැයි | 5,091 |
| ජුනි | 10,491 |
| සැප්තැම්බර් | 5,091 |
| | **22,014** |

13. **ආයතනයේ අරමුණු ඉටු නොවීම**

2009 අංක 38 දරන ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතනය පනතේ (1) (ඇ) වගන්තිය ප්‍රකාරව ආයතනයේ පොදු පරමාර්ථයක් ලෙස වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විමර්ශන සහ පර්යේෂණ පැවැත්වීම කරගෙන යාම සහ ඒවාට සහයදීම ආයතනයක් වශයෙන් ඉටුකළ යුතු වුවත් 2017 මූල්‍ය වර්ෂයේදී එසේ කටයුතු කර නොතිබුණි. ආයතනයේ 2017 ක්‍රියාකාරී සැලැස්මේ ඒ සඳහා කටයුතු කිරීමට සැලැසුම් කර තිබුණ ද ප්‍රගතියක් නිරීක්ෂනය නොවුණි.

14. **පුස්තකාල භාවිතය**

2009 අංක 38 දරන ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතන පනතේ 3(ඔ) වගන්තියට අනුව ප්‍රකාරව ආයතනයේ වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ පරිචය ප්‍රවර්ධනය කිරීමේ සහ වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා පුස්තකාලය පිහිටුවා පවත්වාගෙන යාම ආයතනයේ පොදු පරමාර්ථයක් වේ.

පුස්තකාලයේ පවතින පොත් පිළිබඳව සටහන් තබාගැනීම සඳහා පවත්වා ගතයුතු පරිග්‍රහන ලේඛනය විගණන දින වන විටත් යාවත්කාලීන කර නොතිබුණි. එම හේතුව නිසා පුස්තකාලයේ පවතින පොත්වල ආරක්ෂාව සම්බන්ධයෙන් ගැටළු මතුවිය හැකි බව නිරීක්ෂණය විය.

15. **භාණ්ඩ සමීක්ෂණය සහ භාණ්ඩ අපහරණය**

මු.රෙ 758 ප්‍රකාරව 2016 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගෙන තිබූ පොදු 47 ආකෘතිය ප්‍රකාරව වාර්තාකර ඉදිරිපත් කර තිබූ ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ සම්බන්ධව විගණන දිනය වන විටත් කටයුතු කර නොතිබුණි.

| | හාණ්ඩ අයිතමය | ප්‍රමාණය |
|---|---|---|
| 01. | Blood Pressure Apparatus | 02 |
| 02. | Computer Cpu – 042084023<br>Monitor<br>Ups – K 254350050K 254300<br>Speakers | 01 |
| 03. | Conference hall chair | 01 |
| 04. | Weighting stcale SAL 427 | 02 |
| 05. | Lecture hall chair (Wood) | 06 |
| 06. | Laser Printer Colour Cannon | 01 |
| 07. | Photocopy machine Toshiba 163 CHF641106 | 01 |
| 08 | Printer Epson colour Laser | 01 |
| 09. | Printer colour Ink – Jet HP | 01 |
| 10. | Printer colour Laser Epson | 01 |

16. අගරු වූ චෙක්

ආයතනය විසින් භාණ්ඩ හා සේවාවන් ලබාගැනීම සඳහා නිකුත් කර තිබූ චෙක්පත් 05 ක් නිවැරදි ආකාරයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් අගරු වී ඇති අතර ඒ සඳහා නැවත ගෙවීම සිදුකර තිබුණි. එම චෙක්පත් බොහොමයක් අගරු වී තිබුණේ එකඟ වී ඇති රෙගුලාසිවලට අනුකූල නොවීම හේතුවෙනි. ආයතනයේ නොසැලකිලිමත්කම හේතුවෙන් අගරු වූ චෙක්පත් සඳහා ගාස්තුවක් දැරීමට සිදුවන බව නිරීක්ෂණය විය.

| | වව්චර් අංකය | චෙක්පත ඉදිරිපත් කර තිබූ ආයතන / පුද්ගලයා | අගරු වීමට හේතුව | වටිනාකම (රු.) |
|---|---|---|---|---|
| i. | 2017/248 | Base hp (pvt) Ltd. | Cheque not drawn in accordance with mandate | 22,640.00 |
| ii. | 2017/240 | Associated Newspaper of Ceylon | Amount in words & Figures differ | 120,474.00 |
| iii. | 2017/222 | Base hp (pvt) Ltd. | Cheque not drawn in accordance with mandate | 22,640.00 |
| iv. | 2017/208 | A.M Somasiri | Cheque not drawn in accordance with mandate | 15,000.00 |
| v. | 2017/186 | Topshine Environmental Service (pvt) Ltd. | Cheque not drawn in accordance with mandate | 50,606.57 |
| | | | | **231,360.57** |

## 17. හැකියා / ධාරිතා සංවර්ධන ව්‍යාපෘතිය (Capachity Development Project / ILO Project)

ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) විසින් ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර පළාත් සඳහා වෘත්තීය ආරක්ෂණය සහ සෞඛ්‍ය සම්බන්ධ හැකියා සංවර්ධන පුහුණු වැඩසටහන සඳහා අනුග්‍රහය ලබා දී තිබුණි. ඒ සඳහා ඇති කරගෙන තිබූ ගිවිසුම ප්‍රකාරව වැඩසටහන සඳහා මාස 03 ක කාලයක් ලබා දී තිබූ අතර රු.2,299,389.65 ක මුදලක් ඒ සඳහා ලබා දීමට එකඟ වී තිබුණි.

එහි දී සිදුකළ විගණන පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(අ) ගිවිසුමේ 4.2 ඡේදය ප්‍රකාරව ජාත්‍යයන්තර කම්කරු සංවිධානය විසින් ගිවිසුම් ගත මුදල ආයතනය වෙත නිදහස් කරනු ලබන්නේ වැඩසටහන සම්බන්ධව ක්‍රියාත්මක වී ඇති කාර්යයන් සඳහා සෑහීමකට පත්වන්නේ නම් පමණක් බව දක්වා ඇති අතර, වැඩසටහන සඳහා රු.2,299,389.65 ක මුදලක් ආයතනය දරා තිබුණු නමුත් රු. 660,750 ක මුදලක් පමණක් අත්තිකාම් ලෙස ලබා දී තිබුණි. ඉතිරි මුදල රු. 1,638,639 ක් ආයතනය වෙත ලැබිය යුතු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) ගිවිසුම ප්‍රකාරව වැඩසටහන සඳහා අත්තිකාරම් මුදල රු. 660,750 ක් පමණක් ලැබී තිබූ අතර ඉතිරි මුදල ආයතනයේ අරමුදල් උපයෝගී කරගෙන සිදුකර ගෙන තිබුණි. කෙසේ වෙතත් දෙපාර්ශවය අතර ඇති කරගත් ගිවිසුමේ 4.3.2 ඡේදය ප්‍රකාරව ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් අත්තිකාරම් මුදලින් පසුව අනුමත කරන ලද තාක්ෂණික ප්‍රගති වාර්තාව (Technical Progress report – Annexc) මත වැඩසටහනේ ප්‍රගතිය සඳහා ගෙවීම් කරන බව දන්වා ඇත. (Progress Payment)

මේ අනුව ගිවිසුම ප්‍රකාරව කොටස් වශයෙන් ලැබිය යුතු මුදල ආයතනය විසින් එකවර ඉල්ලුම් කිරීමක් සිදුකර ඇති අතර ගිවිසුමේ 1.1 ඡේදය ප්‍රකාරව 2017.05.30 දින අත්සන් තබා එකඟ වූ ගිවිසුමට හැර ගිවිසුමට සම්බන්ධ පාර්ශවයන් අතර වාචිකව හෝ ලිඛිතව ඇතිවන අනෙකුත් එකඟතාවයන් වලට අනුකූල නොවන ලෙස ආයතනය විසින් කටයුතු කර ඇති බව නිරීක්ෂණය විය.

(ඇ) ගිවිසුමේ 3.2.2.1 සහ 4.1 ඡේද ප්‍රකාරව වැඩසටහන සඳහා ගිවිසුම් ගත මුදල් ලබා දීමට, ව්‍යාපෘතියේ නමින් (SKILLED Project - SRL/12/01 M/EEC) වෙනම බැංකු ගිණුමක් ආරම්භ කරන ලෙස සඳහන්ව ඇති නමුත් ආයතනය විසින් ගිවිසුමේ පරිදි කටයුතු ඉටුකර නොතිබුණි. ආයතනය විසින් දැනට ආයතනයේ නමින් පවත්වාගෙන යන බැංකු ගිණුම හරහා ගිවිසුමේ සඳහන් පරිදි අත්තිකාරම් මුදල ලෙස රු.660,750 ක මුදලක් ලබා දී තිබුණි .

(ඈ) ව්‍යාපෘතියේ (Inpute Item 0.2) ප්‍රචාහන කටයුතු සඳහා වෙන්කළ මුදල ඉක්මවා රු.102,790 ක් ආයතනය දරා තිබුණි. එසේම (Inpute Item 3.2.1) යටතේ පසු විපරම් කටයුතු සඳහා රු. 17,500 මුදලක් වෙන්කර තිබුණද ව්‍යාපෘතියේ සාර්ථකත්වය පිළිබඳ පසුවිපරම් කටයුතු සිදුකර නොතිබුණි. එසේම ක්‍රියාත්මක කිරීමේ ගිවිසුමේ 1-2 (Implementation agreement) අනුව ආයතනය අවසාන වාර්තාව ජාත්‍යන්තර කම්කරු සංවිධානය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) ගිවිසුමේ 3.6 ඡේදය ප්‍රකාරව ගිවිසුමේ එකඟතාවලට අනුකූල නොවීම මත අනාගත ගෙවීම් තාවකාලිකව නැවැත්වීමට කටයුතු කරනු ඇත. ඒ අනුව ආයතනය වෙත ලැබීමට ඇති ඉතිරි රු. 1,638,639 ක මුදල ලැබීම අවිනිශ්චිත වියහැකි බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඊ) ගිවිසුම ප්‍රකාරව ආයතනය විසින් වැඩසටහන සම්බන්ධව ජාත්‍යන්තර කම්කරු සංවිධානය වෙත ඉදිරිපත් කළයුතු පහත ආකෘතීන් විගණනයට විගණනයට ඉදිරිපත් නොවිය.

i. Annex C - Technical Progress report Format
ii. Annex E - Expenditure Forecast Format
iii. Annex I - Workplan Format

ඉහත විගණන නිරීක්ෂණ සම්බන්ධයෙන් ඔබගේ අදහස් හා පැහැදිලි කිරීම මෙම ලිපියේ දින සිට දින 07 ක් ඇතුළත දන්වා එවන මෙන් ඉල්ලමි.

D.M.C.K. JAYATHILAKE
Superintendent of A...
Auditor General's Department

ඩී.එම්.සී.කේ. ජයතිලක,
විගණන අධිකාරී.

පිටපත - ලේකම්, කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශය.